
කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව



වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2025

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1	ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	1
1.2	ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු	4
1.3	ප්‍රධාන කාර්යයන්	5
1.4	සංවිධාන සටහන	7
1.5	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ	8
1.6	අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / පළාත් සභාව යටතේ පවතින ආයතන / අරමුදල්	8
1.7	විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු	8

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.0	ප්‍රගතිය	9
2.1	අංශයේ කාර්ය සාධනය පිලිබඳ සමාලෝචනය	13
2.2	සංවර්ධන වැඩසටහන් ප්‍රගතිය 2025	17
2.3	පර්යේෂණ සහ රසායනාගාර සේවා	24
2.4	ප්‍රාග්ධන ව්‍යාපෘති	28
2.5	ආයතනික පාලනය සහ පරිපාලනය	31
2.6	විශේෂ ජයග්‍රහණ	33
2.7	ප්‍රධාන අභියෝග හා ඒවා අවම කිරීමට ගත් පියවර	35
2.8	අනාගත දිශානතිය සහ ඉලක්ක	37

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	40
3.2	මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය	41
3.3	මුදල් ප්‍රවාහ පිලිබඳ ප්‍රකාශය	42
3.4	මූල්‍ය ප්‍රකාශ සටහන්	43
3.5	විගණකාධිපතිවරයාගේ වාර්තාව	46

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

4.1	ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	61

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1	හැඳින්වීම	69
5.2	හඳුනාගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු සහ ළඟා කරගත් ප්‍රගතිය	69
5.3	2025 වර්ෂයේ ප්‍රධාන මෙහෙයුම් ජයග්‍රහණ සහ කාර්ය සාධන සමාලෝචනය	70
5.4	පවතින අභියෝග සහ අනාගත උපායමාර්ග	71

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	72
6.2	ආයතනයේ ක්‍රියාකාරීත්වයට මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය	74
6.3	මානව සම්පත් සංවර්ධනය	75

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව **79**

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1

ශ්‍රී ලංකාවේ කීර්ති නාමය ලොව පුරා ප්‍රචලිත කිරීමට දායක වූ බෝගයක් වේ නම් එය අන් කවරක් හෝ නොව කුරුඳු බව අවිවාදිත ය. සියවස් ගණනාවක් තිස්සේ ලංකා කුරුඳු සඳහා ලොව පුරා පැවති ඉල්ලුම හේතුවෙන් බොහෝ විදේශීය ජාතීන් මෙරටට ඇදී ආ අතර 16 වන සියවසේ සිට සියවස් පහකට ආසන්න කාලයක් අර්ධ වශයෙන් සහ පූර්ණ වශයෙන් මෙරට බටහිර රටවල යටත් විජිතයක්ව පැවතීමට ද මෙම බෝගය ප්‍රධානතම හේතුවක් විය. පෘතුගීසි පාලන සමයේදී ශ්‍රී ලංකාවේ කුරුඳු කර්මාන්තය ක්‍රමවත් කිරීම සඳහා කුරුඳු සකස් කිරීම, කුරුඳු එකතු කිරීම හා අපනයන පාලනය සිදු කරන ලදී. එහි දී කුරුඳු නිෂ්පාදන මත බදු හා අනිවාර්ය සේවා ක්‍රම පවත්වාගෙන යන ලදී.

ඉන් අනතුරුව ලන්දේසි පාලන සමයේ දී (1658-1796) ලන්දේසීන් විසින් විශේෂයෙන්ම Dutch East India Company කුරුඳු වෙළඳාම ඉතා විධිමත් ලෙස සංවිධානය කරන ලදී. ඒ අනුව ලන්දේසීන් විසින් කුරුඳු කර්මාන්තය පරිපාලනය සඳහා නිල දෙපාර්තමේන්තුමය ව්‍යුහයක් ස්ථාපිත කර එය "මහ බද්ද දෙපාර්තමේන්තුව" ලෙස කුරුඳු දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. ලන්දේසි යුගයේ දී මෙම දෙපාර්තමේන්තුව වඩාත් විධිමත්ව පවත්වාගෙන යාමට ද කටයුතු කරන ලද අතර පළමු වරට ශ්‍රී ලංකාවේ වාණිජව කුරුඳු වගා කර අස්වැන්න ලබා ගැනීම ආරම්භ කරන ලද්දේ ලන්දේසීන් විසිනි.

ඉංග්‍රීසි පාලන සමයේ දී ලංකා කුරුඳු සඳහා තිබූ රාජ්‍ය ප්‍රමුඛතාව කෝපි, තේ සහ රබර් වැනි වැවිලි බෝග වෙත යොමු වූ අතර මිල අධික ලංකා කුරුඳු වලට මිල අඩු ආදේශකයක් ලෙස කැෂියා කුරුඳු ලෝක වෙළඳපළ තුළ ඉස්මතු වන්නට විය. එසේම ලංකා කුරුඳු වෙනත් විදේශීය රටවල්වල වගා කිරීම මගින් ලංකා කුරුඳුවල ඒකාධිකාරය බිඳ දැමීමට ද ඉංග්‍රීසීන් විසින් උත්සාහ දරන ලදී.

කුරුඳු බෝගය සම්බන්ධයෙන් නැවතත් ශ්‍රී ලංකාවේ අවධානය යොමුවීම ආරම්භ වන්නේ නිදහස ලබා දශකයක් පමණ ගතවන විට ය. විශේෂයයෙන් වසර 100 ක පමණ කාලයක් තේ වගාව සඳහා යොදාගනු ලැබූ ඉඩම් ආන්තික නිසරු ඉඩම් බවට ක්‍රමයෙන් පත්වන්නට වීමත් සමග තේ වගාවෙන් ඉවත් වන

ඉඩම් සඳහා සුදුසු ක්‍රියාමාර්ග හඳුනාගැනීමට එවකට පැවති රජයන් විසින් කටයුතු කරන ලදී. ඒ අනුව 1968 වසරේ දී පත් කරන්නට යෙදුණු තේ කොමිෂන් සභාවේ 18 වන සැසි වාර්තාව මගින් තේ වගාවෙන් ඉවත්වන ඉඩම්වල කුරුඳු ඇතුලු සුළු අපනයන බෝග වගා කිරීම සුදුසු බවට නිර්දේශ කරනු ලැබ ඇත. ඒ අනුව 1972 වසරේ දී මෙම අරමුණ සපුරාලනු වස් වැවිලි අමාත්‍යාංශය යටතේ සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව පිහිටුවීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් අනුමැතිය ලබා ගන්නා ලදී. 1975 වසරේදී මෙම දෙපාර්තමේන්තුව කෘෂිකර්ම අමාත්‍යාංශය යටතට පත් කරන ලද අතර එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සහ ලෝක ආහාර වැඩසටහන (WFP) මගින් ක්‍රියාත්මක කළ බෝග විවිධාංගීකරණ සංවර්ධන වැඩසටහන සමඟ ඒකාබද්ධව කටයුතු කරන ලදී.

1992 වසරේ දී පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලද පාර්ලිමේන්තු පනත් අංක 42 අපනයන කෘෂිකර්මාන්ත ප්‍රවර්ධන පනත මගින් දෙපාර්තමේන්තු නාමය අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වශයෙන් වෙනස් කරන ලද අතර නව පනත මගින් කුරුඳු ඇතුලු අනෙකුත් අපනයන කෘෂි බෝග ප්‍රවර්ධනය සඳහා අවශ්‍යව තිබූ නීතිමය රාමුව සකස් කරනු ලැබීය. මෙම දෙපාර්තමේන්තුව යටතේ වසර 50 කට වැඩි කාලයක් තුළ කුරුඳු වගාවත් එමගින් ලැබූ විදේශ විනිමය ප්‍රමාණයත් විශාල ලෙස ඉහළ ගිය අතර කුරුඳු ශ්‍රී ලංකාවේ සිව්වැනි ප්‍රධාන අපනයන බෝගය දක්වා වර්ධනය වීමට සමත් විය.

2022 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ හෙක්ටාර 36506 ක කුරුඳු වගා වපසරියක් දිස්ත්‍රික්ක 17ක් පුරා ව්‍යාප්තව පැවති අතර වාර්ෂික නිෂ්පාදනය මෙ.ටොන් 24000 ක් පමණ විය. එම වසරේ කුරුඳු අපනයනයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 217 ක විදේශ විනිමයක් උපයාගෙන ඇත. එසේම 2022 වසරේ දී යුරෝපා සංගමය විසින් කුරුඳු සඳහා භූගෝලීය දර්ශක සහතිකය (GI) ලබා දුන් අතර ශ්‍රී ලංකාවේ මෙතෙක් මෙම තත්ත්වය හිමිකරගත් එකම නිෂ්පාදනය කුරුඳු වේ. ලංකා කුරුඳු සහ එහි අගය එකතු කළ නිෂ්පාදන සඳහා ඉහළ අපනයන විභවයක් පැවතීමත්, ශ්‍රී ලංකාවටම ආවේණික කර්මාන්තයක් වීමත් හේතුවෙන් කුරුඳු කර්මාන්තය තවදුරටත් සංවර්ධනය කළ යුතු බවත්, ශ්‍රී ලංකාවේ සුළු අපනයන බෝග අතරින් ප්‍රමුඛස්ථානයේ සිටිමින් වැඩිම විදේශීය විනිමයක් ඉපැයීමට දායක වූ කුරුඳු බෝගය වාණිජ වැවිලි බෝගයක් ලෙස ප්‍රවර්ධනය කළ යුතු බවත් හඳුනාගනු ලැබිණ.

ශ්‍රී ලංකාවේ කුරුඳු කර්මාන්තයේ සංවර්ධනය වෙනුවෙන්ම වෙන්වූ ආයතනයක් පිහිටුවිය යුතු බවට කුරුඳු කර්මාන්තයේ පාර්ශ්වකරුවන් වෙතින් දීර්ඝ කාලයක් තිස්සේ ඉල්ලීමක් පැවති අතර කුරුඳු ප්‍රධාන වැවිලි බෝගයක් ලෙස සංවර්ධනය කිරීමේ අරමුණෙන් කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීම සඳහා 2023 අයවැය යෝජනා අංක 16 ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද යෝජනාව සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලැබුණි. ඉන් අනතුරුව 2023 අගෝස්තු මස 10 දින අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 38/2023 හා 2023.08.10 දිනැති ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 23/1501/601/050 හා 2023.08.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2023. 09. 01 දින සිට කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු ආරම්භ

කිරීමටත්, එම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවේ වැඩිම කුරුඳු වගා ඉඩම් ප්‍රමාණයක් ඇති කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටුවීමටත්, කුරුඳු කර්මාන්තයට අදාළ කටයුතු නියාමනය සඳහා අවශ්‍ය නීතිමය රාමුව සැකසීම වෙනුවෙන් කුරුඳු සංවර්ධන පනත් කෙටුම්පතක් සැකසීමටත් ඉදිරිපත් කර තිබූ යෝජනාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවිය. ඒ අනුව දෙපාර්තමේන්තුව පිහිටුවීමේ කටයුතු 2023 සැප්තැම්බර් 01 දින බත්තරමුල්ල සෙත්සිරිපාය පරිශ්‍රයේ දී සිදුවිය.

අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 2024.01.01 දින සිට මෙම දෙපාර්තමේන්තුවේ කටයුතු ආරම්භ කිරීමත් සමග කුරුඳු කර්මාන්තය සඳහා දස අවුරුදු මාර්ග සිතියමක් සියලු පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් සකස් කිරීම ආරම්භ කරන ලද අතර සෑම අංශයක්ම නියෝජනය වන පරිදි අදහස් ලබා ගැනීමෙන් සකස් කරන ලද කුරුඳු සංවර්ධනය සඳහා වන දස අවුරුදු මාර්ග සිතියමේ කෙටුම්පතක් නිකුත් කර ඇත. මෙම මාර්ග සිතියම පදනම් කරගනිමින් කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා 2025-2029 පස් අවුරුදු උපාය මාර්ගික සැළැස්මක් ද සකස් කර ඇත. කුරුඳු කර්මාන්තයේ නියාමනය වෙනුවෙන් සකස් කරන ලද කුරුඳු සංවර්ධන පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව මගින් සකස් කර අවසන් කරනු ලැබ ඇති අතර එහි ඉදිරි කටයුතු සම්බන්ධ ප්‍රතිපත්තිමය තීරණයක් ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීමට නියමිතව ඇත. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පැවති මාතර, පලොල්පිටියේ පිහිටි ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරා දීම සඳහා 2023.12.28 වන දින කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යතුමන් විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 59/2023 ට ලද අංක 24/0089/612/008 හා 2024.01.24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව එම ආයතනය ද කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ මේ වන විට ක්‍රියාත්මක වේ. 2024 සැප්තැම්බර් මස දී මෙම දෙපාර්තමේන්තුව පරිසර, වනජීවී, වන සම්පත්, ජල සම්පාදන, වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතට පත් කරන ලද අතර එයින් පසු නව අමාත්‍ය මණ්ඩලය පත් කිරීමත් සමග එම වසරේ නොවැම්බර් මස සිට නැවතත් වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශ විෂය පථයට එක් කරන ලදී. 2025.10.18 දිනැති අංක 2458/65 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නැවතත් මෙම දෙපාර්තමේන්තුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතට පත් කර ඇත.

2025 වර්ෂය අවසන් වන විට ශ්‍රී ලංකාවේ කුරුඳු වගා කර ඇති භූමි ප්‍රමාණය හෙක්ටයාර 39,444ක් වන අතර වාර්ෂික කුරුඳු අපනයන පරිමාව මෙට්‍රික් ටොන් 20,454 ක් වේ. ලංකා ඉතිහාසයේ කුරුඳු අපනයනය කිරීමෙන් ලැබූ වැඩිම ආදායම වන ඇමරිකානු ඩොලර් මිලියන 260ක මුදල (ආසන්න වශයෙන් රුපියල් කෝටි 8000) 2025 වර්ෂයේ දී ශ්‍රී ලංකාවට ලැබුනු අතර එය කුරුඳු කර්මාන්තයේ මධ්‍ය කාලීන හා දිගුකාලීන ඉලක්ක වන 2030 වර්ෂය වන විට ඇමරිකානු ඩොලර් මිලියන 500 කර්මාන්තයක් බවටත් 2025 වර්ෂය වන විට ඇමරිකානු ඩොලර් බිලියන එකක කර්මාන්තයක් බවට පත්කරලීමට ඇති හැකියාව ඉහල නංවන්නක් බව සඳහන් කළ යුතු ය.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු



අපගේ දැක්ම (Vision)

"ලංකා කුරුඳු ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම අපනයන-අභිමුඛ වැවිලි බෝගය ලෙස ස්ථානගත කිරීම."

මෙහෙවර (Mission)

තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීම, තත්ත්ව ප්‍රමිතීන් ඉහළ නැංවීම, වෙළඳපොළ ප්‍රවේශය පුළුල් කිරීම යන උපාය මාර්ගික මූලපිරීම් තුලින් ජාතික ආර්ථිකයට ශ්‍රී ලංකාවේ කුරුඳු කර්මාන්තයේ දායකත්වය ශක්තිමත් කිරීම සහ සියලු පාර්ශ්වකරුවන්ගේ යහපැවැත්ම වැඩිදියුණු කිරීම.

අරමුණු

2023. 08. 14 දිනැතිව අමාත්‍ය මණ්ඩලය අනුමත කරනු ලැබ ඇති අංක **23/1501/601/050** දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ස්ථාපිත සහ **2023. 08. 10** දිනැති අංක **38/2023** දරණ 'කුරුඳු සංවර්ධනය සඳහා නව දෙපාර්තමේන්තුවක් පිහිටුවීම' මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු පහත පරිදි වේ.



අරමුණු....

1. නිෂ්පාදන පද්ධති නවීකරණය, පසු අස්වනු කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, සහ සමූහ ව්‍යාපාර ශක්තිමත් කිරීම තුළින් කුරුඳු නිෂ්පාදනය, වගා බිමේ ඵලදායීතාව සහ ගොවීන්ගේ ආදායම් ඉහළ නැංවීම
2. ඉහළ වටිනාකම සහිත සහ අධි මිල වෙළඳපොළවලට ප්‍රවේශ වීම අරමුණු කර ගනිමින් අගය එකතු කිරීම, නිෂ්පාදන විවිධාංගීකරණය සහ නව්‍යකරණය මඟින් කුරුඳු කර්මාන්තයේ වේගවත් පරිවර්තනයක් සිදු කිරීම.
3. පවතින කුරුඳු අපනයන වෙළඳපොළවල ශ්‍රී ලංකාවේ තරගකාරීත්වය ශක්තිමත් කිරීමට සමගාමීව නව කලාපීය සහ ගෝලීය වෙළඳපොළවලට ප්‍රවේශය පුළුල් කිරීම.
4. ගෝලීය තිරසාරත්වය, කාබනික සහ ගුණාත්මක භාවය සහතික කිරීමේ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි දේශගුණ විපර්යාසයන්ට ඔරොත්තු දෙන සහ පරිසර හිතකාමී කුරුඳු කර්මාන්තයක් ස්ථාපිත කිරීම.
5. කුරුඳු කර්මාන්ත ක්ෂේත්‍රය තුළ සඵලදායී පාලනය, සම්බන්ධීකරණය සහ දැනුම උත්පාදනයට සහාය වන ආයතනික සහ ප්‍රතිපත්තිමය පරිසරයක් නිර්මාණය කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්


දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

- සුලු පරිමාණ, මධ්‍ය පරිමාණ සහ වැවිලි අංශය තුළ කුරුඳු වගාව ප්‍රවර්ධනය කිරීම.
- කුරුඳු භෝගයට අදාළව භෝග වැඩිදියුණු කිරීම, පාංශු හා ශාක පෝෂක කළමනාකරණය, ශාක ආරක්ෂණය, පසු අස්වනු තාක්ෂණය සහ සමස්ත වගා කළමනාකරණය සම්බන්ධ බහුවිධ පර්යේෂණ සිදු කිරීම.
- කුරුඳු වගාවේ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) සහ යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) ප්‍රවර්ධනය කිරීම.
- කුරුඳු භූගෝලීය දර්ශක (GI) සහතිකකරණයට අදාළ විගණන කටයුතු සිදු කිරීම.
- කුරුඳු සහ කුරුඳු ආශ්‍රිත නිෂ්පාදන සඳහා අපනයන ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- කුරුඳු වගාව හා කර්මාන්තය සම්බන්ධ දත්ත පද්ධති පවත්වා ගෙන යාම සහ යාවත්කාලීන කිරීම.
- කුරුඳු වගාව, සැකසුම සහ නිෂ්පාදනය සම්බන්ධ ව්‍යාප්ති සහ උපදේශන සේවාවන් සැපයීම.
- කුරුඳු වගාව, සැකසුම සහ වෙළඳාමට සම්බන්ධ පාර්ශ්වකරුවන් පුහුණු කිරීම.
- කුරුඳු වගා ආරක්ෂණය සහ පාංශු පෝෂක කළමනාකරණය සම්බන්ධ උපදේශන සේවාවන් සැපයීම.
- කුරුඳු නිෂ්පාදනයට අදාළ විද්‍යාගාර පරීක්ෂණ සේවාවන් පවත්වා ගෙන යාම.
- කුරුඳු සංවර්ධනය සඳහා රාජ්‍ය, අර්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන සහ පුද්ගලික ආයතන සමග අන්තර්-ආයතන සම්බන්ධතා පවත්වා ගෙන යාම.
- කුරුඳු භෝගයට අදාළ ජාන සම්පත් එක්රැස් කිරීම, සංරක්ෂණය, පවත්වා ගෙන යාම සහ ඇගයීම.

1

1.4 සංවිධාන සටහන



1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

1.5.1 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

🔬 පර්යේෂණ හා සංවර්ධන අංශය

👥 පාලන අංශය

💰 මූල්‍ය අංශය

📊 සැලසුම් අංශය

🔍 අභ්‍යන්තර විගණන අංශය

1.5.2 කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පවත්නා ආයතන :-



ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය
පලොල්පිටිය, තිහගොඩ

1.6 අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / පළාත් සභාව යටතේ පවතින ආයතන / අරමුදල්

අදාළ නොවේ.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු

අදාළ නොවේ.


පරිච්ඡේදය 02

2.0 ප්‍රගතිය


කුරුඳු ක්ෂේත්‍රයේ 2025.12.31 දිනට ප්‍රගතිය

2


කුරුඳු නිෂ්පාදනය (කි.ග්‍රෑ.මී)




අපනයන ආදායම (රු.මිලි.)




අපනයන ආදායම (ඇ.ඩො.මී)



අපනයන ප්‍රමාණය (කි.ග්‍රෑ.මී)



කුරුඳුවල සාමාන්‍ය අලෙවි මිල (රු./ කි.ග්‍රෑ)



කුරුඳු නිෂ්පාදනයේ වර්ගීකරණය

නිෂ්පාදන වර්ගය	2025.12.31 දිනට (මෙට්‍රික් ටොන්)		
	2023	2024	2025
කුරුඳු පොතු ආශ්‍රිත නිෂ්පාදන (මෙට්‍රික් ටොන්)	19,676	19,546	19,726
කුරුඳු කොළ තෙල් (මෙට්‍රික් ටොන්)	198	241	213
කුරුඳු පොතු තෙල් (මෙට්‍රික් ටොන්)	6.68	21.13	20.0
එකතුව	19,880.68	19,808.13	19,959.00

2

2025 අයවැය ප්‍රතිපාදන - ප්‍රගතිය

2025 අයවැය ප්‍රතිපාදන - ප්‍රගතිය

විස්තරය	අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන (රු.)	මුලු ශුද්ධ ප්‍රතිපාදනය (රු.)	වියදම (2025.12.31 දිනට) (රු.)	අතැති බිල්
පුනරාවර්තන				
පුද්ගල පඩිනඩි	82,000,000.00	102,990,000.00	98,685,171.65	-
වෙනත් පුනරාවර්තන වියදම්	60,000,000.00	38,010,000.00	27,955,528.31	-
උප එකතුව	142,000,000.00	141,000,000.00	126,640,699.96	-
ප්‍රාග්ධන				
සිනමන් ගේට් ව්‍යාපෘතිය	275,000,000.00	262,500,000.00	64,347,513.09	-
ආයතනික ප්‍රාග්ධන වියදම්	130,000,000.00	142,500,000.00	125,071,902.90	-
උප එකතුව	405,000,000.00	406,000,000.00	189,419,415.99	-
මුළු එකතුව	547,000,000.00	547,000,000.00	316,060,115.95	-

2025 වර්ෂයේ අයවැයෙන් ප්‍රතිපාදන වෙන් වන මූලධන වැය විෂයන් වලට අදාල 2025.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය

වැය විෂය	වැය විස්තරය	අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන (රු)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (රු)	2025.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු)	2025.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (%)
	මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම.				
2001	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	7,500,000.00	7,500,000.00	5,346,878.11	71%
2002	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	15,500,000.00	15,500,000.00	12,777,417.60	82%
2003	වාහන	4,000,000.00	4,000,000.00	2,212,167.85	55%
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම				
2102	ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ	5,000,000.00	5,000,000.00	4,917,077.60	98%
2103	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	1,000,000.00	1,000,000.00	920,265.00	92%
2105	ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම	1,000,000.00	2,000,000.00	342,524.06	17%
2106	මෘදුකාංග සංවර්ධනය	3,000,000.00	3,000,000.00	0.00	0%
	හැකියා වර්ධනය				
2401	කාර්ය මණ්ඩල පුහුණු	500,000.00	500,000.00	265,000.00	53%
	වෙනත් මූලධන වියදම්				
2507	පර්යේෂණ හා සංවර්ධනය	5,000,000.00	5,000,000.00	4,944,147.87	98%
2104	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	262,500,000.00	262,500,000.00	64,347,513.09	24%
2202	ලංකා කුරුඳු කර්මාන්තය පුනර්ජීවනය කිරීම සඳහා වගාකරුවන්ට සහායවීම	100,000,000.00	100,000,000.00	93,346,424.81	93%
එකතුව	මූලධන වියදම්	405,000,000.00	406,000,000.00	189,419,415.99	47%

2.1. අංශයේ කාර්ය සාධනය පිලිබඳ සමාලෝචනය

2025 වර්ෂය තුළ ජාතික කුරුඳු කර්මාන්තයට අදාළව නිෂ්පාදන ධාරිතාවය සහ අපනයන ආදායමෙහි ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කරන අතර, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අපනයන සංචිතය සඳහා එම අංශයෙන් ඉටුකරනු ලබන අඛණ්ඩ දායකත්වය මෙයින් යළි තහවුරු වේ.

2

2.1.1. ජාතික නිෂ්පාදන කාර්යසාධනය

2025 දෙසැම්බර් 31 දිනට පවතින තාවකාලික දත්තයන්ට අනුව, "සත්‍ය ලංකා කුරුඳු" (Ceylon Cinnamon) සමස්ත ජාතික නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 26,000ක් පමණ වෙතැයි ඇස්තමේන්තු කර ඇත. මෙය පෙර වර්ෂයට සාපේක්ෂව මධ්‍යස්ථ මට්ටමේ වර්ධනයක් වන අතර, සාම්ප්‍රදායික මෙන්ම සාම්ප්‍රදායික නොවන වගා ප්‍රදේශයන්හි වගාවන් ක්‍රමිකව යථා තත්ත්වයට පත්වීම සහ ව්‍යාප්ත වීම මෙයට හේතු වී ඇත.

නිෂ්පාදනය ඉහළ යාම කෙරෙහි කුරුඳු අලුතින් වගා කිරීමේ වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම, කුරුඳු වගා භූමි ඵලදායිතාව ඉහළ නැංවීමේ මුලපිරීම් සහ වගාකරුවන් වෙත ලබාදුන් තාක්ෂණික උපදෙස් වැඩිදියුණු කිරීම මූලික වශයෙන් හේතු වී ඇත. තවද, වියළි කලාපීය දිස්ත්‍රික්ක වෙත කුරුඳු වගාව ව්‍යාප්ත කිරීම සහ ක්ෂේත්‍ර මට්ටමේ උපදේශන සේවාවන් ශක්තිමත් කිරීම ද නිෂ්පාදන මට්ටම තිරසාරව පවත්වා ගැනීමට ඉවහල් වී තිබේ.

ඒකක භූමි ප්‍රමාණයක ඵලදායිතාව, බෝගයේ පූර්ණ විභවතාවයට වඩා තවමත් අඩු මට්ටමක පැවතුණද, සමස්ත නිෂ්පාදනයේ පවතින ස්ථාවර වර්ධනය මගින් ගොවීන්ගේ දායකත්වය ඉහළ යාම සහ මෙම අංශය තුළ සිදුකරන අඛණ්ඩ ආයෝජනයන් පෙන්නුම් කරයි.

2.1.2 අපනයන කාර්යසාධනය

2025 වර්ෂයේදී සමස්ත කුරුඳු අපනයන ප්‍රමාණය දළ වශයෙන් මෙට්‍රික් ටොන් 20,500ක් දක්වා ළඟා වූ අතර, එමගින් "සත්‍ය කුරුඳු" (*Cinnamomum verum*) ලොව ප්‍රමුඛතම සැපයුම්කරු ලෙස ශ්‍රී ලංකාව සතු ස්ථානය තවදුරටත් ආරක්ෂා කර ගැනීමට හැකි වී ඇත. 2025 වර්ෂය තුළ ලෝකයේ රටවල් 90කට ආසන්න ප්‍රමාණයක් ලංකා කුරුඳු අපනයනය කර ඇත.

2024 වර්ෂයේදී ඇමරිකානු ඩොලර් මිලියන 226ක් වූ කුරුඳු සහ කුරුඳු ආශ්‍රිත නිෂ්පාදනවල සමස්ත අපනයන ආදායම, 2025 වර්ෂය වන විට ඇමරිකානු ඩොලර් මිලියන 260ක් දක්වා වර්ධනය වී තිබේ. මෙය පෙර වර්ෂයට සාපේක්ෂව අපනයන ආදායමෙහි **15%ක** පමණ වාර්ෂික වර්ධනයකි.

අපනයන ආදායමෙහි මෙම වර්ධනය කෙරෙහි පහත කරුණු බලපා ඇත:

- ලංකා කුරුඳු (Ceylon Cinnamon) සඳහා පවතින ස්ථාවර ගෝලීය ඉල්ලුම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ **ශාක ස්වස්ථතා අවශ්‍යතා** (Phytosanitary requirements) සපුරාලීම ශක්තිමත් කිරීම.
- වෙළඳපොළ ප්‍රවේශය සඳහා අඛණ්ඩව පහසුකම් සැලසීම.
- **අගය එකතු කළ** කුරුඳු නිෂ්පාදන (Value-added products) ක්‍රමිකව ව්‍යාප්ත වීම.


ගෝලීය ආර්ථික අවිනිශ්චිතතාවන් මධ්‍යයේ වුවද, අපනයන පරිමාව සහ ආදායම් වර්ධනය යන අංශ දෙකෙහිම ස්ථාවරත්වය ආරක්ෂා කර ගනිමින් කුරුඳු ක්ෂේත්‍රය සිය ඔරොත්තු දීමේ හැකියාව ප්‍රදර්ශනය කර ඇත.

2.1.3 ජාතික අපනයනය සඳහා දායකත්වය

2025 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ සමස්ත භාණ්ඩ අපනයන ආදායම (Total Merchandise Export) ඇමරිකානු ඩොලර් මිලියන 13,579.38ක් විය. එහිදී කුරුඳු අපනයනය මගින් උපයා ඇති ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 260ක් වන අතර, එය සමස්ත ජාතික භාණ්ඩ අපනයනයෙන් **1.91%ක** පමණ ප්‍රතිශතයකි.

2024 වර්ෂයේදී සමස්ත භාණ්ඩ අපනයනයෙන් කුරුඳු අපනයනය සඳහා හිමිවූයේ **1.76%ක** ප්‍රතිශතයක් වූ අතර, එම අගයට සාපේක්ෂව 2025 වර්ෂයේදී පැහැදිලි වර්ධනයක් දක්නට ලැබේ.

සමස්ත අපනයන ක්ෂේත්‍රය තුළ කුරුඳු කර්මාන්තය නිරපේක්ෂ අගයන් අනුව සාපේක්ෂව කුඩා කොටසක් නියෝජනය කළද, එය ඉහළම වටිනාකමකින් යුත් කෘෂිකාර්මික අපනයන බෝගයක් ලෙසත්, ලොව පිළිගත් "සත්‍ය කුරුඳු" සඳහා පවතින එකම මූලාශ්‍රය ලෙසත් තවදුරටත් වැදගත් වේ. 2025 වර්ෂයේදී ජාතික අපනයන සංයුතිය තුළ කුරුඳු සඳහා හිමි වූ කොටස ඉහළ යාම මගින්, විදේශ විනිමය උත්පාදනය කිරීමෙහිලා මෙම අංශය සතු වර්ධනය වෙමින් පවතින වැදගත්කම මනාව පැහැදිලි වේ.



2.1.4 නිෂ්පාදන-අපනයන සබඳතාව (Production–Export Relationship)

2025 වර්ෂයේ ඇස්තමේන්තුගත සමස්ත නිෂ්පාදනය වන මෙට්‍රික් ටොන් 26,000න් දළ වශයෙන් මෙට්‍රික් ටොන් 20,500ක් අපනයනය කර ඇත. ඉතිරි ප්‍රමාණය පහත සඳහන් අංශ සඳහා යොදාගෙන තිබේ:

- දේශීය පරිභෝජනය.
- අගය එකතු කළ නිෂ්පාදන සඳහා වැඩිදුර සැකසුම් කටයුතු.
- කාර්මික භාවිතය සහ තොග පවත්වාගෙන යාම.

නිෂ්පාදනයට සාපේක්ෂව පවතින මෙම ඉහළ අපනයන අනුපාතය මගින් කුරුඳු කර්මාන්තය සතු **අපනයන අභිමුඛ ස්වභාවය** (Export-oriented nature) සහ ජාත්‍යන්තර වෙළඳපොළ සමඟ පවතින ශක්තිමත් ඒකාබද්ධතාවය මනාව පැහැදිලි වේ.

2.1.5 කුරුඳු කර්මාන්ත අංශයේ ප්‍රවණතා (2020–2025)

පසුගිය වසර හය තුළ අපනයන ආදායම පිළිබඳ සමාලෝචනයක දී ගෝලීය වෙළඳ ගතිකත්වයන්, විනිමය අනුපාත උච්චාවචනයන් සහ ජාත්‍යන්තර ඉල්ලුම් රටාවන් මත පදනම් වූ වෙනස්වීම් දැකිය හැකිය.

වර්ෂය	කුරුඳු අපනයන ආදායම (ඇ.ඩො. මිලියන)
2020	227
2021	250
2022	227
2023	214
2024	226
2025	**260**

2023 වර්ෂයේ දක්නට ලැබුණු පසුබෑමෙන් අනතුරුව, 2024 සහ 2025 වර්ෂවලදී මෙම අංශය යළි පිබිදීමක් සහ වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර, සමාලෝචිත වසර හයක කාලපරිච්ඡේදය තුළ **ඉහළම අපනයන ආදායම** 2025 වර්ෂයේදී වාර්තා වී ඇත. මෙම ඉහළ යාමේ ප්‍රවණතාව මගින් ක්ෂේත්‍රයේ ස්ථායීතාවය මෙන්ම වගා ව්‍යාප්තිය, ගුණාත්මකභාවය සහතික කිරීම සහ වෙළඳපොළ පහසුකම් සැලසීම වෙනුවෙන් සිදුකරන ලද **ආයතනික මැදිහත්වීම්** (Institutional interventions) ශක්තිමත් වී ඇති බව තහවුරු වේ.

2.1.6 නිරීක්ෂණයන්

- ජාතික නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 26,000ක් දක්වා ළඟා වී ඇති අතර, එමගින් වගා කටයුතුවල ක්‍රමික ව්‍යාප්තියක් පෙන්නුම් කරයි.
- 2025 වර්ෂයේ දී අපනයන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 260ක් දක්වා කැපී පෙනෙන ලෙස වර්ධනය වී තිබේ.
- සමස්ත භාණ්ඩ අපනයනය සඳහා කුරුඳු අපනයනය මගින් දක්වන දායකත්වය **1.91%** දක්වා ඉහළ ගොස් ඇත.
- නිෂ්පාදනයෙන් **75%කට** වඩා වැඩි ප්‍රමාණයක් ජාත්‍යන්තර වෙළඳපොළට යොමු කෙරෙන බැවින්, මෙම අංශය තවදුරටත් ඉහළ අපනයන අභිමුඛතාවක් සහිත ක්ෂේත්‍රයක් ලෙස පවතී.
- විදේශ විනිමය උපයනය තවදුරටත් ඉහළ නැංවීම සඳහා එලදායිතාව වැඩිකිරීම සහ අගය එකතු කිරීමේ ක්‍රියාවලිය (Value addition) කෙරෙහි අඛණ්ඩ අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ.

2.2. සංවර්ධන වැඩසටහන් ප්‍රගතිය 2025

සමාලෝචිත වර්ෂය තුළ කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කුරුඳු නව වගාව ව්‍යාප්ත කිරීම, කුරුඳු වගාවේ භූමි ඵලදායිතාව නැංවීම, සැකසුම් ධාරිතාව ශක්තිමත් කිරීම, ගුණාත්මක ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සහ වෙළඳපොළ තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ඉලක්කගත සංවර්ධන වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදී. ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීම සහ අගය දාමයේ (Value chain) කාර්යක්ෂමතාව වර්ධනය කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින් මෙම වැඩසටහන් **289 වැය ශීර්ෂය** සහ **337 වැය ශීර්ෂය** යටතේ ක්‍රියාත්මක විය.

2.2.1 නව වගා ප්‍රවර්ධන වැඩසටහන

වැඩිවන ගෝලීය ඉල්ලුම සපුරාලීම සහ ජාතික නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම සඳහා කුරුඳු වගාව ව්‍යාප්ත කිරීම ප්‍රධාන උපායමාර්ගික මැදිහත්වීමක් ලෙස පවතී. ඒ අනුව, 2025 වර්ෂයේදී සාම්ප්‍රදායික සහ සාම්ප්‍රදායික නොවන දිස්ත්‍රික්ක පුරා නව වගා වැඩසටහන් 289 සහ 337 වැය ශීර්ෂයන් යටතේ ක්‍රියාත්මක කරන ලදී.

(අ) 289 වැය ශීර්ෂය යටතේ ක්‍රියාත්මක කිරීම

289 වැය ශීර්ෂය යටතේ හෙක්ටයාර 508.16ක් පමණ ආවරණය වන පරිදි කුරුඳු පැළ 4,572,658ක් බෙදා දෙන ලදී. මෙහිදී රජයේ දායකත්වය රුපියල් මිලියන 60.17ක් වූ අතර, වැඩසටහනේ සමස්ත ආයෝජන වටිනාකම රුපියල් 114,316,450ක් විය.

ප්‍රතිලාභී ප්‍රධාන දිස්ත්‍රික්ක:

- හම්බන්තොට – හෙක්ටයාර 106.23
- ගාල්ල – හෙක්ටයාර 71.06
- රත්නපුර – හෙක්ටයාර 70.78
- මාතර – හෙක්ටයාර 63.93
- කුරුණෑගල – හෙක්ටයාර 58.39


විශේෂයෙන්ම අනුරාධපුරය, පොළොන්නරුව සහ මොණරාගල වැනි වියළි කලාපීය දිස්ත්‍රික්ක වෙත වගාව ව්‍යාප්ත කිරීම මගින් වගාව භූගෝලීය වශයෙන් විවිධාංගීකරණය කිරීමට දරන අඛණ්ඩ උත්සාහය පිළිබිඹු වේ.

(ආ) 337 වැය ශීර්ෂය යටතේ ක්‍රියාත්මක කිරීම

337 වැය ශීර්ෂය යටතේ හෙක්ටයාර 565.56ක් ආවරණය කරමින් තවත් පැළ 5,089,997ක් බෙදා දී ඇත. ඒ සඳහා රජයේ දායකත්වය රුපියල් මිලියන 62.66ක් වූ අතර සමස්ත වැඩසටහන් ආයෝජනය රුපියල් 127,249,925ක් විය.

ඉහළම වගා ව්‍යාප්තිය පහත දිස්ත්‍රික්කවලින් වාර්තා විය:

- රත්නපුර – හෙක්ටයාර 191.47
- ගාල්ල – හෙක්ටයාර 105.14
- මාතර – හෙක්ටයාර 90.78
- කළුතර – හෙක්ටයාර 23.03
- කුරුණෑගල – හෙක්ටයාර 23.39



රූපය 2.1: කුරුඳු නව වගා ප්‍රවර්ධන වැඩසටහන - සමස්ත ප්‍රගතිය

නව වගා ප්‍රවර්ධන වැඩසටහන මගින් 2025 වර්ෂය තුළ සමස්තයක් ලෙස පැළ 9,662,655ක් බෙදා හැර ඇති අතර, ඒ මගින් හෙක්ටයාර 1,073.72ක් පමණ නව වගාවන් ලෙස ව්‍යාප්ත කර ඇත. මෙම මහා පරිමාණ ව්‍යාප්තිය අනාගත නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම සඳහා සිදුකළ සුවිශේෂී දායකත්වයකි. තවද, දෙපාර්තමේන්තුව සහ ලියාපදිංචි පැළ තවාන් අතර පවතින සාර්ථක සහයෝගීතාවය මෙයින් පිළිබිඹු වන අතර, එමගින් ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය සැපයීම සහතික කර ඇත.

2.2.2 භූමි ඵලදායිතාව ඉහළ නැංවීමේ වැඩසටහන

කුරුඳු වගාවන්ගෙන් සැළකිය යුතු ප්‍රමාණයක් වයස්ගත වීම හෝ අසතුටුදායක අස්වැන්නක් ලබාදීම යන කරුණු සැළකිල්ලට ගත් කළ, පවතින කුරුඳු ඉඩම්වල ඵලදායිතාව වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය කරුණකි.

2

(අ) 289 වැය ශීර්ෂය යටතේ ක්‍රියාත්මක කිරීම

මේ යටතේ හෙක්ටයාර 441.08ක් ආවරණය කරමින් පැළ 588,862ක් බෙදා දී ඇත. මේ සඳහා රජයේ දායකත්වය රුපියල් මිලියන 24.07ක් වූ අතර සමස්ත වැඩසටහන් ආයෝජනය රුපියල් 588,86200කි. ප්‍රධාන මැදිහත්වීම් වාර්තා වූ දිස්ත්‍රික්ක:

- රත්නපුර – හෙක්ටයාර 136.63
- ගාල්ල – හෙක්ටයාර 117.09
- මාතර – හෙක්ටයාර 78.85
- හම්බන්තොට – හෙක්ටයාර 50.16

(ආ) 337 වැය ශීර්ෂය යටතේ ක්‍රියාත්මක කිරීම

337 වැය ශීර්ෂය යටතේ හෙක්ටයාර 331.50ක් ආවරණය වන පරිදි පැළ 369,401ක් බෙදා දී ඇත. රජයේ දායකත්වය රුපියල් මිලියන25.29ක් වූ අතර සමස්ත ආයෝජනය රුපියල් 36,940,100කි. සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළ දිස්ත්‍රික්ක:

- ගාල්ල – හෙක්ටයාර 153.53
- මාතර – හෙක්ටයාර 74.83
- රත්නපුර – හෙක්ටයාර 43.20

වැය ශීර්ෂයන් ද්විත්වයම යටතේ භූමි ඵලදායිතාව ඉහළ නැංවීමේ වැඩසටහන මගින් දැනට පවතින කුරුඳු ඉඩම් හෙක්ටයාර 772.99ක් පමණ **පුනරුත්ථාපනය** කිරීමට සහය ලබා දී ඇත. පහත සඳහන් ගැටළු සඳහා විසඳුම් ලබාදීම මගින් මධ්‍යකාලීනව අස්වැන්න ක්‍රමයෙන් ඉහළ නැංවීමට මෙම මැදිහත්වීම ඉවහල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- පැළ ඝනත්වය අවම වීම.
- වයස්ගත පඳුරු පැවතීම.
- පෝෂක ඌණතාවයන්.
- පළිබෝධ සහ රෝග බලපෑම්.



රූපය 2.2: භූමි ඵලදායිතාව ඉහළ නැංවීමේ වැඩසටහන - සමස්ත ප්‍රගතිය

2.2.3 සැකසුම් කටයුතු නවීකරණය සහ තාක්ෂණික ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීම

නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම, අස්වැන්න නෙළීමෙන් පසු සිදුවන හානිය අවම කිරීම සහ අගය එකතු කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා සුදුසු තාක්ෂණික ක්‍රම හඳුන්වා දීමට දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය ආධාර සපයන ලදී.

2025 වර්ෂයේදී රුපියල් මිලියන 26.37 ක රජයේ දායකත්වයෙන් යුතුව සමස්තයක් ලෙස උපකරණ ඒකක 56ක් සඳහා සහය ලබා දී ඇත. ඒ යටතේ ලබා දුන් උපකරණ අතරට පහත සඳහන් දැ ඇතුළත් වේ:

- **කැබිනට් වියළන යන්ත්‍ර** (Cabinet dryers)
- **තල වියළන යන්ත්‍ර** (Flat-bed dryers)
- **වර්ණ වර්ගීකරණ යන්ත්‍ර** (Colour sorting machines)
- **කුරුඳු කුඩු කරන යන්ත්‍ර**
- **කුරුඳු කැපීමේ යන්ත්‍ර**
- **කොළ තෙල් නිස්සාරණ ඒකක** (කිලෝග්‍රෑම් 250කට වැඩි ධාරිතාවයෙන් යුත් ඒකක 09ක්)

- **පොතු තෙල් නිස්සාරණ ඒකක**
- **මධ්‍යම සැකසුම් මධ්‍යස්ථාන**
- **ජල-සිසිලන ඇඹරුම් යන්ත්‍ර** (Water-cooled grinders)
- **පොලිතීන් සීල් කරන යන්ත්‍ර**
- **විවිධ ප්‍රමාණයේ සැකසුම් ඒකක** (වර්ග අඩි 400–1000 දක්වා)

මෙම ආයෝජන මගින් පහත ප්‍රතිලාභ අපේක්ෂා කෙරේ:

- නිෂ්පාදිතයන්හි ඒකාකාරී බව (Product uniformity) වැඩිදියුණු කිරීම.
- අපවිත්‍ර වීමේ අවදානම අවම කිරීම.
- ජාත්‍යන්තර ආහාර සුරක්ෂිතතා ප්‍රමිතීන්ට අනුකූල වීම ශක්තිමත් කිරීම.
- ඉහළ අගය එකතු කළ නිෂ්පාදන සැකසීමට පහසුකම් සැලසීම.

2

අගය එකතු කළ නිෂ්පාදන අපනයනය තවමත් එහි උපරිම විභවතාවයට වඩා අඩු මට්ටමක පැවතුණද, තොග වශයෙන් කුරුඳු කූරු (Quills) අපනයනය කිරීමෙන් මිදී සැකසූ සහ සන්නාමගත නිෂ්පාදන (Branded products) කරා යොමු වීමට නම් අඛණ්ඩව තාක්ෂණය ශ්‍රේණිගත කිරීම අත්‍යවශ්‍ය වේ.

2.2.4 සහතිකකරණය සහ තත්ත්ව සහයෝගීතාව

තත්ත්ව සහතිකකරණය සහ ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා අවශ්‍ය මූල්‍ය හා තාක්ෂණික සහය ලබා දීමට දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

2025 වර්ෂය තුළ:

- සහතිකකරණ සහය (Certification support) සඳහා ඒකක 3කට මූල්‍ය ආධාර සපයන ලදී.
- **යහපත් කෘෂිකාර්මික පිළිවෙත්** (Good Agricultural Practices - GAP) සහතිකය ලබා ගැනීම සඳහා ගොවීන්ට සහයෝගය දක්වන ලදී.
- **භූගෝලීය දර්ශක** (Geographical Indication - GI) සහතිකකරණය සඳහා ඉල්ලුම් කළ පාර්ශ්වයන් වෙනුවෙන් අවසාන විගණන කටයුතු සිදු කරන ලදී.

මෙම පියවරයන් මගින් නිෂ්පාදනවල අනුරේඛනය (Traceability), ගුණාත්මකභාවය සහතික කිරීම සහ විශේෂයෙන්ම ඉහළ වටිනාකමක් සහිත වෙළඳපොළවල් ඇතුළු ආනයනික රටවල අවශ්‍යතා සපුරාලීම ශක්තිමත් විය.

- **කුරුඳු අපනයන ප්‍රවර්ධන වැඩසටහන්**

  2025 වර්ෂය තුළ සාම්ප්‍රදායික කුරුඳු අපනයනය කරන රටවල්වලට අමතර චීන සමූහාණ්ඩුව වෙත කුරුඳු අපනයනය කිරීමට අවශ්‍ය නෛතික පියවර ගෙන කුරුඳු අපනයනය කිරීමට පහසුකම් සැලසීමට කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවට හැකියාව ලැබුණි. මේ සඳහා චීනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ අපනයන සංවර්ධන මණ්ඩලයේ සහය ලබා ගන්නා ලදී.

2.2.5 ක්ෂුද්‍ර වාරිමාර්ග සහ බෝග ආරක්ෂණ සහය

බෝග හානි අවම කිරීම සහ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා:

- ක්ෂුද්‍ර වාරි පද්ධති (Micro irrigation systems) සඳහා සහය ලබා දෙන ලදී (පද්ධති 01).
- බෝග ආරක්ෂණ වැටවල් (Crop protection fencing) ලබා දෙන ලදී (ඒකක 03).
- **ඒකාබද්ධ පළිබෝධ පාලන** (Integrated Pest Management - IPM) දැනුවත් කිරීමේ වැඩසටහන් තීව්‍ර කරන ලදී.


මෙම මැදිහත්වීම් මගින් දේශගුණික විපර්යාස සහ පළිබෝධ ව්‍යාප්තිය හේතුවෙන් පැන නගින අභියෝග සඳහා විසඳුම් ලබා දීමට උත්සාහ කරන ලදී.

2.2.6 ධාරිතා සංවර්ධනය සහ පුහුණුව (සංවර්ධන අංශය)

2025 වර්ෂයේ දී ධාරිතා සංවර්ධනය කෙරෙහි ප්‍රමුඛ අවධානයක් යොමු කරන ලදී. ඒ අනුව, ප්‍රතිලාභීන් 18,221 දෙනෙකු වෙනුවෙන් සමස්තයක් ලෙස පුහුණු වැඩසටහන් 701ක් පවත්වන ලදී.

එහි විස්තරාත්මක බෙදීම පහත පරිදි වේ:

- **ගොවි පුහුණු වැඩසටහන්** : වැඩසටහන් 582 (ප්‍රතිලාභීන් 15,625)
- **ක්ෂේත්‍ර දින (Field days)** : වැඩසටහන් 100 (ප්‍රතිලාභීන් 2,125)
- **ආයතනික පුහුණු පහසුකම්** : වැඩසටහන් 07 (ප්‍රතිලාභීන් 128)
- **පුහුණුකරුවන් පුහුණු කිරීම** : වැඩසටහන් 03 (ප්‍රතිලාභීන් 58)
- **ඩිජිටල් ව්‍යාප්ති වැඩසටහන්** : වැඩසටහන් 09 (ප්‍රතිලාභීන් 285)



මෙම වැඩසටහන් හරහා පහත අංශ පිළිබඳ දැනුම වර්ධනය කරන ලදී:

1. යහපත් කෘෂිකාර්මික පිළිවෙත්.
2. පළිබෝධ සහ රෝග කළමනාකරණය.
3. නිවැරදි අස්වැන්න නෙළීමේ තාක්ෂණික ක්‍රම.
4. අස්වැන්න නෙළීමෙන් පසු පරිහරණය.
5. අගය එකතු කිරීම සහ සැකසීම.



සමාලෝචිත වර්ෂය තුළ ක්ෂේත්‍ර මට්ටමේ ව්‍යාප්ති සේවා කටයුතුවල දක්නට ලැබුණු පුළුල් ප්‍රවේශය මෙම ඉහළ සහභාගීත්වයෙන් මනාව පිළිබිඹු වේ.

2

2.2.7 සංවර්ධන වැය ශීර්ෂයන්හි මූල්‍ය ප්‍රගතිය

2025 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රගතිය පහත පරිදි වේ:

- **337 වැය ශීර්ෂය:** රුපියල් මිලියන 100ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර, එහි මූල්‍ය ප්‍රගතිය 93%ක් ලෙස වාර්තා විය.
- **289 වැය ශීර්ෂය:** රුපියල් මිලියන 150ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර, එහි මූල්‍ය ප්‍රගතිය 74%ක් ලෙස වාර්තා විය.

වර්ෂයේ අවසාන භාගයේදී ඇති වූ අයහපත් කාලගුණික තත්ත්වයන් (ද්විත්වා සුලි කුණාටුව) සහ ප්‍රතිපාදන මුදා හැරීමේ ප්‍රමුඛතා වෙනස්වීම් වැනි අභියෝග මධ්‍යයේ වුවද, සමස්ත මූල්‍ය කාර්යසාධනය මගින් සතුටුදායක අයවැය භාවිතයක් පිළිබිඹු වේ.

2.2.8 මුහුණ දුන් අභියෝග සහ ඒවා අවම කිරීමට ගත් පියවර

2025 වර්ෂය තුළ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මෙහෙයුම් මට්ටමේ අභියෝග කිහිපයකට මුහුණ දීමට සිදු විය:

- ප්‍රතිපාදන මුදා හැරීමේ ප්‍රමුඛතා වෙනස්වීම් සහ ප්‍රමාදයන්.
- පුහුණු කුරුඳු තලන්නන්ගේ හිඟය.
- වගා කටයුතු සඳහා බලපෑ අයහපත් කාලගුණික තත්ත්වයන්.
- පළිබෝධ සහ රෝග ව්‍යාප්තිය ඉහළ යාම.

එම අභියෝග අවම කිරීම සඳහා පහත පියවර ගන්නා ලදී:

- ප්‍රමුඛතාවය මත පදනම් වූ මූල්‍ය කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම.
- ප්‍රාදේශීය මට්ටමින් කුරුඳු තලන්නන් පුහුණු කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම.
- පුනරුත්ථාපනය කළ යුතු බලපෑමට ලක් වූ වගාබිම් හඳුනා ගැනීම.
- ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ කටයුතු ශක්තිමත් කිරීම.

2.3. පර්යේෂණ සහ රසායනාගාර සේවා

කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ පර්යේෂණ අංශය, මාතර තිහගොඩ පිහිටි **ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය (NCRTC)** මගින් ක්‍රියාත්මක වේ. ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය, "සත්‍ය කුරුඳු" (*Cinnamomum verum*) වෙනුවෙන්ම වෙන්වූ ලොව පවතින ප්‍රධානතම සහ එකම පර්යේෂණ ආයතනය ලෙස කටයුතු කරයි. මෙම මධ්‍යස්ථානය බෝග විද්‍යාව හා බෝග වැඩිදියුණු කිරීම, පස සහ ශාක පෝෂණය, ශාක ආරක්ෂණය සහ අස්වැන්න නෙළීමෙන් පසු තාක්ෂණය පිළිබඳ විශේෂිත රසායනාගාරවලින් මෙන්ම පූර්ණ පහසුකම් සහිත පුහුණු ඒකකයකින් ද සමන්විත වේ.

2025 වර්ෂය තුළ ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය, ජාතික සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ඵලදායිතාව ඉහළ නැංවීම, නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, ඉහළ කාර්යසාධනයක් සහිත ප්‍රභේද සංවර්ධනය කිරීම, තිරසාර පාංශු හා ශාක පෝෂණ කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම සහ පරිසර හිතකාමී පළිබෝධ සහ රෝග කළමනාකරණ පිළිවෙත් ශක්තිමත් කිරීම කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කරන ලදී.

2.3.1 ක්‍රියාත්මක කරන ලද පර්යේෂණ වැඩසටහන්

2025 වර්ෂයේ දී පර්යේෂණ අංශය විසින් පර්යේෂණ ව්‍යාපෘති 21ක් ක්‍රියාත්මක කරන ලද අතර, ඉන් සමහරක් දේශීය හා විදේශීය විශ්වවිද්‍යාල, පර්යේෂණ ආයතන සහ කර්මාන්ත ශාලා සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක විය. මෙම අධ්‍යයනයන් කර්මාන්තයේ අවශ්‍යතා සමඟ සමපාත වූ අතර නිෂ්පාදනය, අස්වැන්න නෙළීමෙන් පසු කළමනාකරණය සහ අගය එකතු කිරීම කෙරෙහි බලපාන ප්‍රධාන බාධකයන් සඳහා විසඳුම් ලබා දීමට ඉලක්ක කරන ලදී.

පර්යේෂණ අවධානය යොමු වූ ප්‍රධාන ක්ෂේත්‍ර:

- ඵලදායිතාව කෙරෙහි භූමි හායනයෙහි (Land degradation) බලපෑම ඇගයීම.
- උද්භිද විද්‍යාත්මක පළිබෝධ පාලන ද්‍රව්‍ය (Botanical pest control agents) සංවර්ධනය කිරීම.
- සුදු මුල් රෝග කළමනාකරණය ප්‍රශස්ත කිරීම.
- අස්වැන්න නෙළීමෙන් පසු ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම.
- නිෂ්පාදන විවිධාංගීකරණය සහ අගය එකතු කළ නිෂ්පාදන සූත්‍රගත කිරීම.
- කුරුඳු සැකසීමේ සම්ප්‍රදායන් පිළිබඳ සංස්කෘතික හා උරුම ලේඛනගත කිරීම.

ව්‍යවහාරික පර්යේෂණ සොයාගැනීම් කිහිපයක් ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ ප්‍රායෝගික අදාළත්වයක් පෙන්නුම් කළේය. නිදසුනක් වශයෙන්, *Derris parviflora* ශාඛයේ මූල සාරය කුරුඳු පැල මැක්කා (Thrips) පළිබෝධකයන්ට එරෙහිව ප්‍රබල කෘමි නාශක ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කරන බව පර්යේෂණාගාර පරීක්ෂණ (In vitro assays) මගින් තහවුරු වූ අතර, එමගින් උද්භිද විද්‍යාත්මක විකල්ප පළිබෝධ පාලන ක්‍රම සංවර්ධනය කිරීමේ හැකියාව පෙන්නුම් කෙරිණි. එලෙසම, දිලීර නාශක යෙදිය යුතු ප්‍රශස්ත ප්‍රමාණයන් පිළිබඳ පර්යේෂණ මගින් සුදු මුල් රෝගය ඵලදායී ලෙස පාලනය කිරීම සඳහා සාක්ෂි මත පදනම් වූ නිර්දේශ ලබා දීමට හැකි විය.

මීට අමතරව, හතු වගාව සඳහා උප ස්ථරයක් ලෙස කුරුඳු කුරුට්ට (Cinnamon scrapings) භාවිත කිරීම පිළිබඳ පර්යේෂණ මගින් සැකසුම් අපද්‍රව්‍ය සඳහා අගය එකතු කළ හැකි බව තහවුරු වූ අතර, එය සම්පත් භාවිතයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට දායක වේ.

2.3.2 පර්යේෂණ ප්‍රකාශන – 2025

පර්යේෂණ අංශය වර්ෂය තුළ සැලකිය යුතු ශාස්ත්‍රීය නිමැවුම් ප්‍රමාණයක් ලබා දී ඇත. ඒ අනුව, ජාතික හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ විද්වත් හමුවල දී පර්යේෂණ ප්‍රකාශන 12ක් ඉදිරිපත් කරන ලදී. මෙම ප්‍රකාශන මගින් පහත සඳහන් විවිධ තේමාවන් ආවරණය විය:

- ඵලදායිතාව ඉහළ නැංවීම.
- පාංශු ක්ෂුද්‍ර ජීව විද්‍යාව සහ පොහොර අන්තර්ක්‍රියා.
- සංවේදන ගුණාත්මකභාවය (Organoleptic quality) හඳුනා ගැනීම.
- කුරුඳු ආශ්‍රිත ආහාර නිෂ්පාදන සංවර්ධනය කිරීම.
- කුරුඳු සැකසීමේ සංස්කෘතික උරුමයන් හඳුනා ගැනීම.

ශාස්ත්‍රීය වේදිකාවන් හරහා පර්යේෂණ සොයාගැනීම් ව්‍යාප්ත කිරීම මගින් "ලංකා කුරුඳු" සතු විද්‍යාත්මක ප්‍රතිරූපය ශක්තිමත් වූ අතර, සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්තිමය සාකච්ඡාවන් සඳහා ද එය දායක විය.

2.3.3 පර්යේෂණ සිසුන් අධීක්ෂණය කිරීම

2025 වර්ෂයේ දී ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය මගින් දේශීය විශ්වවිද්‍යාලවල පර්යේෂණ සිසුන් 13 දෙනෙකු අධීක්ෂණය කරන ලදී. එමගින් කෘෂිකාර්මික විද්‍යා ක්ෂේත්‍රයේ ජාතික මානව සම්පත් සංවර්ධනය සඳහා සහය ලබා දෙන ලදී. මෙම මැදිහත්වීම හරහා කුරුඳු වගාව, පළිබෝධ කළමනාකරණය, පාංශු සෞඛ්‍යය සහ අගය එකතු කිරීම පිළිබඳ ජාතික දැනුම පද්ධතිය පුළුල් කිරීමට මධ්‍යස්ථානය දායක විය.

2.3.4 රසායනාගාර සේවා සහ සාම්පල විශ්ලේෂණය

පාංශු හා ශාක පෝෂණ සහ පසු අස්වනු තාක්ෂණ අංශයේ ප්‍රතීතනය ලත් (Accredited) රසායනාගාර පහසුකම් මගින් අදාළ පාර්ශ්වකරුවන් වෙත විශ්ලේෂණ සේවා අඛණ්ඩව සපයන ලදී. 2025 වර්ෂය තුළ පස, පොහොර සහ කුරුඳු නිෂ්පාදන සාම්පල 2,226ක් විශ්ලේෂණය කර රසායනාගාර වාර්තා නිකුත් කර ඇත.

මෙම රසායනාගාර සේවාවන් මගින් පහත අංශ සඳහා සහය ලැබේ:

- ගුණාත්මකභාවය සහතික කිරීම.
- අපනයන ප්‍රමිතීන්ට අනුකූල වීම.
- පෝෂක කළමනාකරණ නිර්දේශ ලබා දීම.
- නිෂ්පාදන පරාමිතීන් සත්‍යාපනය කිරීම.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ (SLSI) ISO 17025 ප්‍රතීතනය අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර, වර්ෂය තුළ ප්‍රතීතනය ලත් පරාමිතීන් සංඛ්‍යාව 18ක් දක්වා ව්‍යාප්ත කරන ලදී. මෙම ව්‍යාප්තිය මගින් අපනයනකරුවන්ට සහ සැකසුම්කරුවන්ට ලබා දෙන රසායනාගාර සේවාවන්හි විශ්වසනීයත්වය තවදුරටත් ඉහළ යයි.

2.3.5 පුහුණුව සහ දැනුම ව්‍යාප්ත කිරීම

පර්යේෂණ කටයුතුවලට අමතරව, ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය විසින් 2025 වර්ෂයේදී පුළුල් පුහුණු හා ව්‍යාප්ති වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව ව්‍යුහගත පුහුණු වැඩසටහන් 75ක් පවත්වා පුහුණුලාභීන් 1,461 දෙනෙකු බිහි කරන ලදී.

පුහුණු වැඩසටහන් මගින් ආවරණය වූ ප්‍රධාන ක්ෂේත්‍ර:

- **යහපත් නිෂ්පාදන පිළිවෙත්** (GMP) යටතේ කුරුඳු සැකසීම (වැඩසටහන් 41).
- අගය එකතු කිරීමේ තාක්ෂණික ක්‍රම.
- තෙල් ආසවනය (Oil distillation).
- තවාන් කළමනාකරණය.
- කාබනික කුරුඳු වගාව.
- භූමි කළමනාකරණ පිළිවෙත්.

GMP ප්‍රමිතිය මත පදනම් වූ කුරුඳු සැකසීමේ පුහුණුව මගින් පමණක් පුහුණු කුරුඳු තලන්නන් 532 දෙනෙකු බිහි කර ඇති අතර, එමගින් සැකසුම් කටයුතුවල පවතින ශ්‍රම හිඟයට විසඳුම් ලබා දී ඇත.

මීට අමතරව, මධ්‍යස්ථානය විසින් පහත දෑ ද සිදු කරන ලදී:

- ක්ෂේත්‍ර උපදේශන වැඩසටහන් 220ක්.
- දැනුවත් කිරීමේ වැඩසටහන් 53ක්.
- සිසුන් සඳහා සේවාස්ථ පුහුණු වැඩසටහන් (In-plant trainings) 19ක්.

තාක්ෂණික මගපෙන්වීම් සඳහා පාර්ශ්වකරුවන් 4,000කට අධික සංඛ්‍යාවක් දුරකථන මාර්ගයෙන් සම්බන්ධ වූ අතර, පර්යේෂණ නිලධාරීන් කලාපීය, ජාතික සහ ජාත්‍යන්තර සාකච්ඡා 180කට සහභාගී වෙමින් පරිපාලන හා ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා සිය දායකත්වය ලබා දෙන ලදී.


2.3.6 ප්‍රභේද සංවර්ධනය සහ පැළ බෙදා හැරීම

2025 වර්ෂය තුළ, ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය විසින් අලුතින් සංවර්ධනය කරන ලද "ශ්‍රී ගැමුණු" සහ "ශ්‍රී විජය" යන ඉහළ ගුණාත්මකභාවයකින් යුත් ප්‍රභේදවලට අයත් පැළ 612ක් නිකුත් කරන ලදී. ක්ෂේත්‍ර ඇගයීම්වලට අනුව, තෝරාගත් වගා පේළිවල ඉහළ පැවැත්මේ ප්‍රතිශතයක් සහ යහපත් වර්ධන වේගයක් පෙන්නුම් කළ අතර, එමගින් ප්‍රභේද වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය මනාව තහවුරු වේ.

2.3.7 සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල වගා ව්‍යාප්තිය සඳහා දායකත්වය

උතුරු පළාත ඇතුළු සාම්ප්‍රදායික නොවන කලාපවල කුරුඳු වගාව ව්‍යාප්ත කිරීම සඳහා පර්යේෂණ අංශය ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළේය. තාක්ෂණික මගපෙන්වීම් සහ අනුවර්තන පර්යේෂණ (Adaptive research) සහය ලබා දීම හරහා, කුරුඳු වගාව භූගෝලීය වශයෙන් විවිධාංගීකරණය කිරීමට ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය සුවිශේෂී දායකත්වයක් ලබා දී ඇත.

පර්යේෂණ සහ රසායනාගාර කටයුතු පිළිබඳ සාරාංශය – 2025



2

2.4. ප්‍රාග්ධන ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධන ආයෝජනයන් මූලික වශයෙන් යොමු කරන ලද්දේ පොදුවේ "කුරුඳු ද්වාරය" (Cinnamon Gate) ලෙස හඳුන්වනු ලබන **ජාතික කුරුඳු කර්මාන්ත හා සංස්කෘතික ප්‍රවර්ධන මධ්‍යස්ථානය** ස්ථාපනය කිරීම සඳහාය. මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ඇත්තේ "සැබෑ ලංකා කුරුඳු" සතු අනන්‍යතාවය ගෝලීය වශයෙන් පිළිගත් නිෂ්පාදනයක් ලෙස තහවුරු කිරීමටත්, ඒ සමඟ සංස්කෘතික උරුමය, අගය එකතු කිරීම, පර්යේෂණ ව්‍යාප්තිය සහ කෘෂි සංචාරක කර්මාන්තය ඒකාබද්ධ කිරීමටත්ය.

2.4.1 ජාතික කුරුඳු කර්මාන්ත හා සංස්කෘතික ප්‍රවර්ධන මධ්‍යස්ථානය (කුරුඳු ද්වාරය – I වන අදියර)-I කොටස

ශ්‍රී ලංකාවේ අනන්‍ය කුරුඳු උරුමය ප්‍රදර්ශනය කිරීම සඳහාත්, මධ්‍යගත ප්‍රවර්ධනය සඳහාත් ජාතික කුරුඳු කර්මාන්තය ආශ්‍රිත සංස්කෘතික ප්‍රවර්ධන මධ්‍යස්ථානය ව්‍යාපෘතිය සංවර්ධන සන්ධිස්ථානයක් ලෙස සැලකිය හැකිය.

ව්‍යාපෘති විෂය පථය: ව්‍යාපෘතියේ I වන අදියර I කොටස යටතේ වර්ග මීටර් 855ක් (වර්ග අඩි 9,200 ක්) පමණ ආවරණය වන පරිදි භූමිය සකස් කිරීම, අත්තිවාරම් දැමීම, උප ව්‍යුහයන් ඉදිකිරීම සහ ගොඩනැගිල්ලේ ප්‍රධාන ව්‍යුහාත්මක කොටස් එකලස් කිරීම සිදු කරන ලදී. මෙහි මුල් ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව 2023–2024 වුවද, ඉතිරිව පවතින වැඩ කටයුතු අවසන් කිරීම සඳහා ව්‍යාපෘති කාලරාමුව 2025 පෙබරවාරි 22 දක්වා පසුව දීර්ඝ කරන ලදී.

මූල්‍ය සමාලෝචනය:

- **මුළු ඇස්තමේන්තුගත පිරිවැය (වැට් බදු ඇතුළුව)** : රුපියල් මිලියන 224.75
- **කොන්ත්‍රාත් වටිනාකම (වැට් බදු ඇතුළුව)** : රුපියල් මිලියන 161.3
- **සමුච්චිත වියදම (2023–2025)** : රුපියල් මිලියන 132.7
- **භෞතික ප්‍රගතිය** : 100%

වාර්තාකරණ වර්ෂය අවසානය වන විට, I වන අදියරේ I වන කොටසේ වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම නිම කර 100%ක භෞතික ප්‍රගතියක් අත්කරගෙන තිබුණි.

2.4.2 I වන අදියර – II වන කොටස (නිම කිරීමේ කටයුතු)

I වන අදියරේ දෙවන සංරචකයට අභ්‍යන්තර නිම කිරීමේ කටයුතු සහ යාන්ත්‍රික, විදුලි, ජලනල හා ගිනි ආරක්ෂණ පද්ධති ස්ථාපනය කිරීම ඇතුළත් විය. මේ සඳහා ඇස්තමේන්තුගත පිරිවැය (බදු රහිතව) රුපියල් මිලියන 219.25කි. කෙසේ වෙතත්, 2025 වර්ෂය මෙම සංරචකයේ වැඩ කටයුතු ආරම්භ කිරීමට නොහැකි විය.

2025 අගෝස්තු 18 දිනැති අංක **25/1372/813/036** දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, මෙම I වන අදියරේ II කොටසේ ව්‍යාපෘති කටයුතු අත්හිටුවන ලදී. ඉදිරි අමාත්‍ය මණ්ඩල තීරණ සහ සංශෝධිත ක්‍රියාත්මක කිරීමේ සැලසුම්වලට යටත්ව දෙපාර්තමේන්තුව මෙහි ඉදිරි කටයුතු සිදු කරනු ඇත.

2.4.3 II වන අදියර – කෞතුකාගාරය සහ චැලේ (Chalet) සංවර්ධනය

කුරුඇඳු ද්වාර ව්‍යාපෘතියේ II වන අදියර පහත සඳහන් දෑ සඳහා සැලසුම් කර තිබුණි:

- කුරුඇඳු කෞතුකාගාරයක් ඉදිකිරීම.
- චැලේ (Chalet) වර්ගයේ නවාතැන් පහසුකම් සංවර්ධනය කිරීම.
- නරඹන්නන් සඳහා නිදර්ශන යටිතල පහසුකම් සැකසීම.

II වන අදියර සඳහා ඇස්තමේන්තුගත පිරිවැය දළ වශයෙන් රුපියල් මිලියන 538.73කි (බදු රහිතව). ඉහත සඳහන් කළ අමාත්‍ය මණ්ඩල තීරණයටම යටත්ව මෙම අදියර ද 2025 වර්ෂය තුළ ආරම්භ කර නොතිබූ අතර දැනට අත්හිටුවා ඇත.

අදියර	ක්‍රියාකාරකම්	අපේක්ෂිත පිරිවැය (රු. මිලියන)	ව්‍යාපෘති තත්ත්වය
01 වන අදියර - 01 වන කොටස	භූමිය සකස් කිරීම, අත්තිවාරම් වැඩ, උප ව්‍යුහය සහ නිමවුම් රහිත ගොඩනැගිලි කටයුතු (වර්ග මීටර් 855 / වර්ග අඩි 9200)	ඉංජිනේරු ඇස්තමේන්තුව - 165.8 (වැට් සහ අමතර වියදම් රහිතව) 224.75 (වැට් සහ අමතර වියදම් සහිතව)	100% අවසන් කර ඇත
01 වන අදියර - 02 වන කොටස	01 වන කොටසේ නිමවුම් කටයුතු (MEPI පද්ධති ස්ථාපනය ඇතුළුව අවසන් කරන ලද ව්‍යුහයන්)	බදු රහිතව රු. මිලියන 219.25	ආරම්භ කර නොමැත (2025.08.18 දිනැති අංක 25/1372/813/036 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අත්හිටුවා ඇත)
02 වන අදියර	කෞතුකාගාර ගොඩනැගිල්ල සහ නවාතැන් කුටි (Chalets) සම්පූර්ණ කිරීම	බදු රහිතව දළ වශයෙන් රු. මිලියන 538.73	ආරම්භ කර නොමැත (2025.08.18 දිනැති අංක 25/1372/813/036 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අත්හිටුවා ඇත)

2

2.4.4 අයවැය ප්‍රතිපාදන සහ මූල්‍ය ප්‍රතිපාදන – 2025

2025 වර්ෂය සඳහා, I වන අදියරේ II කොටස සහ අපේක්ෂිත II වන අදියරේ වැඩ කටයුතු ආවරණය වන පරිදි රුපියල් මිලියන 275ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. කෙසේ වෙතත්, ඉදිරි අදියරයන් අත්හිටුවීම හේතුවෙන්, වර්ෂය තුළ වියදම් සීමා වූයේ නිම කරන ලද ව්‍යුහාත්මක වැඩවලට අදාළ වගකීම් සඳහා පමණි.

2.4.5 වර්තමාන තත්ත්වය සහ ඉදිරි මග

2025 අවසානය වන විට තත්ත්වය:

Cinnamon Gate ව්‍යාපෘතියේ පළමු අදියර - 01 කොටස (Phase-1, Stage-1) හි කටයුතු 2025.03.31 දින අවසන් කර 2025.06.25 දින මෙම දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත.

Cinnamon Gate ව්‍යාපෘතිය සම්බන්ධව මෙම දෙපාර්තමේන්තුව අයත්ව පැවති වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය මගින් එවකට ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයට 2025.08.26 දිනැතිව ලද අංක අමප/25/1372/813/036 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින්, මෙම ව්‍යාපෘතිය

- රාජ්‍ය හා පුද්ගලික හවුල් සංචාරක ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම හෝ
- ඌන උපයෝජිත ඉඩම බදු දීමට අදාළ ක්‍රමවේදය හරහා ව්‍යාපෘතිය සඳහා වැයවුණු මුදල් රජයට ලබාගත හැකි වන පරිදි සුදුසු ආයෝජකයෙකුට ලබා දීම හෝ
- මෙම යෝජනා අතරින් රජයට වඩාත් වාසිදායකම යෝජනාව හඳුනා ගැනීම පිණිස නිසි අධ්‍යයනයක් සිදු කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම් වෙත නියම කර ඇත.

2.5. ආයතනික පාලනය සහ පරිපාලනය

කුරුඳු අගය දාමය තුළ සංවර්ධන වැඩසටහන්, පර්යේෂණ මුලපිරීම් සහ නියාමන වගකීම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව 2025 වර්ෂයේදී සිය ආයතනික රාමුව තවදුරටත් ශක්තිමත් කරන ලදී. මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ වගවීම ඉහළ නැංවීම සඳහා යහපාලනය, මූල්‍ය විනය, මානව සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය සහ ඩිජිටල් නවීකරණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී.

2.5.1 නීතිමය සහ ආයතනික විෂය පථය

නිෂ්පාදනය, සැකසීම, පර්යේෂණ, සහතිකකරණය සහ අපනයන පහසුකම් සැලසීම යන අංශ ඔස්සේ කුරුඳු ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම, නියාමනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා රජය විසින් පවරා ඇති විෂය පථය යටතේ දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ. ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් සහතික කිරීම පිණිස අපනයන සංවර්ධන මණ්ඩලය, ජාතික ශාක නිරෝධායන සේවාව, ශ්‍රී ලංකා රේගුව, පර්යේෂණ ආයතන සහ පළාත් බලධාරීන් ඇතුළු අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ දෙපාර්තමේන්තුව සමීප සම්බන්ධීකරණයකින් කටයුතු කරයි.

අපනයන අනුකූලතාව, භූගෝලීය දර්ශක (GI) සහතිකකරණය, යහපත් කෘෂිකාර්මික පිළිවෙත්

(GAP) ක්‍රියාත්මක කිරීම සහ ජාත්‍යන්තර වෙළඳපොළ ප්‍රවේශ අවශ්‍යතා සම්බන්ධයෙන් අන්තර්-ආයතනික සම්බන්ධීකරණය විශේෂයෙන් වැදගත් විය.

2.5.2 මානව සම්පත් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වැඩසටහන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම ප්‍රධාන කාර්යාලය, ක්ෂේත්‍ර කාර්යාල සහ ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය පුරා පවතින ප්‍රමාණවත් කාර්ය මණ්ඩලය මත රඳා පවතී.

පවතින පුරප්පාඩු හේතුවෙන් අලුතින් ව්‍යාප්ත කරන ලද වගා ප්‍රදේශයන්හි අධීක්ෂණ සහ ව්‍යාප්ති සේවා ආවරණය කිරීමට යම් බාධා එල්ල විය.

කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධනය සඳහා පහත පියවර ගන්නා ලදී:

- අභ්‍යන්තර පුහුණු වැඩසටහන්.
- නිරීක්ෂණ චාරිකා.
- සම්මන්ත්‍රණ සහ විද්වත් හමුවලට සහභාගී වීම.
- ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය මගින් පවත්වනු ලබන ධාරිතා වර්ධන මුලපිරීම්.

2.5.3 මූල්‍ය කළමනාකරණය

වර්ෂය තුළ මූල්‍ය කළමනාකරණය විනිවිදභාවය, වගවීම සහ රාජ්‍ය අරමුදල් විචක්ෂණශීලීව භාවිත කිරීමේ මූලධර්ම මත පදනම් විය. 337 වැය ශීර්ෂය යටතේ මූල්‍ය ප්‍රගතිය 93%ක් වූ අතර, 289 වැය ශීර්ෂය යටතේ එය 74%ක් විය. මූල්‍ය ප්‍රතිපාදන මුදා හැරීමේ ප්‍රමාදයන් පැවති අවස්ථාවලදී ප්‍රමුඛතාවය මත පදනම් වූ සැලසුම්කරණය හරහා අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු බාධාවකින් තොරව සිදු කිරීමට පියවර ගන්නා ලදී.

2.5.4 අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයන්

ප්‍රසම්පාදන කටයුතු, වත්කම් කළමනාකරණය, තොග පාලනය සහ මූල්‍ය වාර්තාකරණය ආවරණය වන පරිදි අභ්‍යන්තර පාලන පද්ධති පවත්වාගෙන යන ලදී. සියලුම ප්‍රසම්පාදන කටයුතු රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව සිදු කරන ලද අතර, ගෙවීම් සැකසීමට පෙර ක්ෂේත්‍ර පරීක්ෂාවන් සහ සහතික කිරීමේ ක්‍රියා පටිපාටි අනුගමනය කරන ලදී.

2.5.5 ඩිජිටල්කරණය සහ තොරතුරු කළමනාකරණය

ඩිජිටල් නවීකරණය සහ තොරතුරු ව්‍යාප්තිය වැඩිදියුණු කිරීම සඳහා දෙපාර්තමේන්තුව ක්‍රමික පියවර ගෙන ඇත. නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම, තාක්ෂණික පත්‍රිකා ඩිජිටල් මාධ්‍යයෙන් ප්‍රකාශයට පත් කිරීම සහ ඩිජිටල් වේදිකා හරහා පාර්ශ්වකරුවන් සමඟ සන්නිවේදනය කිරීම මෙහිදී ප්‍රධාන විය. වගාබිම් සිතියම්ගත කිරීම, සහතිකකරණ වාර්තා සහ අපනයනකරුවන් ලියාපදිංචි කිරීමේ දත්ත පද්ධති තවදුරටත් වැඩිදියුණු කිරීම අනාගත ඉලක්ක අතර වේ.

2.5.6 අවදානම් කළමනාකරණය

2025 වර්ෂයේදී දෙපාර්තමේන්තුව සහ කුරුඳු ක්ෂේත්‍රය මෙහෙයුම් අවදානම් කිහිපයකට මුහුණ දෙන ලදී:

- අයවැය ප්‍රතිපාදන ප්‍රමාද වීම.
- කුරුඳු තලන්නන්ගේ ශ්‍රම හිඟය.
- අයහපත් දේශගුණික තත්ත්වයන්.
- සාම්ප්‍රදායික අපනයන වෙළඳපොළවල් මත යැපීම.

මෙම අවදානම් අවම කිරීම සඳහා ප්‍රමුඛතා පදනම් කරගත් වියදම් සැලසුම්, පුහුණු වැඩසටහන් ව්‍යාප්ත කිරීම සහ ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය වැනි උපායමාර්ගික පියවර ක්‍රියාත්මක කරන ලදී.

2.6. විශේෂ ජයග්‍රහණ

2025 වර්ෂය තුළ, කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලෝක ප්‍රජාව අතර ලංකා කුරුඳුවල අනන්‍යතාවය තහවුරු කිරීමට, නියාමන අනුකූලතාවය සහ කුරුඳු කර්මාන්තයේ ආයතනික සංවර්ධනය ශක්තිමත් කිරීමට දායක වූ සුවිශේෂී සන්ධිස්ථාන කිහිපයක් සනිටුහන් කරන ලදී.

2.6.1 අපනයන කාර්යසාධනය සහ වෙළඳපොළ තත්ත්වය ශක්තිමත් කිරීම

2025 වර්ෂය කුරුඳු අපනයන ආදායමෙහි කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළ අතර, පසුගිය වසර හයක කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ ඉහළම අපනයන ආදායම වන ඇමරිකානු ඩොලර් මිලියන 260ක් උපයා ගැනීමට හැකි විය. මෙය පෙර වර්ෂවල පැවති උච්චාවචනයන්ගෙන් පසු වාර්තා වූ ශක්තිමත් ප්‍රකෘතිමත් වීමක් සහ ඉහළ යාමේ ප්‍රවණතාවයකි. ජාත්‍යන්තර වෙළඳපොළ තුළ සත්‍ය කුරුඳු සඳහා පවතින අඛණ්ඩ ඉල්ලුම සහ ගුණාත්මක ප්‍රමිතීන් සපුරාලීම මෙයට මූලික විය. 2024 වර්ෂයේ 1.76%ක් වූ ජාතික භාණ්ඩ අපනයන දායකත්වය 2025 වර්ෂයේදී 1.91% දක්වා ඉහළ යාමෙන් විදේශ විනිමය ඉපයීමෙහිලා මෙම අංශයේ වර්ධනය වන වැදගත්කම මනාව පිළිබිඹු වේ.

2.6.2 කුරුඳු වගාව මහා පරිමාණයෙන් ව්‍යාප්ත කිරීම

නව වගා ප්‍රවර්ධන වැඩසටහන යටතේ සිදු කරන ලද මහා පරිමාණ වගා ව්‍යාප්තිය වර්ෂයේ සුවිශේෂී ජයග්‍රහණයකි. 289 සහ 337 වැය ශීර්ෂයන් යටතේ හෙක්ටයාර 1,073ක් පමණ ආවරණය වන පරිදි පැළ මිලියන 9.6කට අධික සංඛ්‍යාවක් බෙදා හරින ලදී. අනුරාධපුර, පොළොන්නරුව සහ මොණරාගල වැනි සාම්ප්‍රදායික නොවන දිස්ත්‍රික්ක වෙත වගාව ව්‍යාප්ත කිරීම මගින් ක්ෂේත්‍රයේ භූගෝලීය විවිධාංගීකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව තහවුරු විය.

2.6.3 සැකසුම් කටයුතු නවීකරණය සහ අගය එකතු කිරීම

රුපියල් මිලියන 26.37කට අධික රජයේ දායකත්වයෙන් සැකසුම් හා තාක්ෂණික උපකරණ ඒකක 63ක් ලබා දීමට දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. මෙම මැදිහත්වීම හරහා අස්වැන්න නෙළීමෙන් පසු පරිහරණ පිළිවෙත් වැඩිදියුණු කිරීම, සෞඛ්‍යාරක්ෂිත සැකසුම් ප්‍රමිතීන් ශක්තිමත් කිරීම සහ තෙල් නිස්සාරණ ධාරිතාව ඉහළ නැංවීම සිදු විය. මෙය තොග වශයෙන් කුරුඳු අපනයනය කිරීමේ සිට අගය එකතු කළ නිෂ්පාදන කරා යොමු වීමේ ප්‍රගතිශීලී පියවරකි.

2.6.4 ධාරිතා සංවර්ධන වැඩසටහන් පුළුල් කිරීම

2025 වර්ෂයේදී සංවර්ධන මට්ටමේ පුහුණු වැඩසටහන් 436ක් පවත්වා ප්‍රතිලාභීන් 12,922 දෙනෙකුට සහය ලබා දෙන ලදී. මීට සමාන්තරව, ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය (NCRTC) විසින් ව්‍යුහාත්මක තාක්ෂණික පුහුණු වැඩසටහන් 75ක් මගින් පුද්ගලයින් 1,461 දෙනෙකු පුහුණු කරන ලදී. විශේෂයෙන්ම, GMP ප්‍රමිතීන් මත පදනම් වූ පුහුණුව මගින් නිපුණතා සහිත කුරුඳු තලන්නන් 532 දෙනෙකු බිහි කිරීම හරහා ක්ෂේත්‍රයේ පවතින පුහුණු ශ්‍රම හිඟයට සෘජු විසඳුම් ලබා දෙන ලදී.

2.6.5 පර්යේෂණ සහ නවෝත්පාදන ශක්තිමත් කිරීම

ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය විසින් ක්ෂේත්‍රයේ ප්‍රධාන අභියෝග ඉලක්ක කරගනිමින් පර්යේෂණ ව්‍යාපෘති 21ක් ක්‍රියාත්මක කරන ලදී. ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් පර්යේෂණ ප්‍රකාශන 12ක් ඉදිරිපත් කිරීම සහ ISO 17025 රසායනාගාර ප්‍රතීතනය තවදුරටත් ව්‍යාප්ත කිරීම හරහා කර්මාන්තයේ පර්යේෂණ පදනම ශක්තිමත් විය.

2.6.6 කුරුඳු කර්මාන්තය අස්පර්ශනීය සංස්කෘතික උරුමයක් ලෙස ප්‍රවර්ධනය කිරීම

ශ්‍රී ලංකාවේ කුරුඳු සැකසීමේ සාම්ප්‍රදායික ශිල්පීය ක්‍රම සහ සංස්කෘතික පිළිවෙත් ලේඛනගත කිරීමේ විශේෂ පර්යේෂණ සිදු කරන ලදී. කුරුඳු කූරු සැකසීමේ තාක්ෂණය සහ ඒ හා බැඳුණු සාම්ප්‍රදායික දැනුම 2025 ජාත්‍යන්තර අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් පිළිබඳ සමුළුවේදී (ICICH 2025) ඉදිරිපත් කරන ලදී. මෙය කුරුඳු හුදු අපනයන භාණ්ඩයක් පමණක් නොව ජාතික වැදගත්කමක් සහිත සංස්කෘතික උරුමයක් ලෙස හඳුනා ගැනීමට මග පාදයි.

2.6.7 "කුරුඳු ද්වාරය" - I වන අදියර (ව්‍යුහාත්මක වැඩ) නිම කිරීම

ජාතික කුරුඳු කර්මාන්ත හා සංස්කෘතික ප්‍රවර්ධන මධ්‍යස්ථානයේ (Cinnamon Gate) I වන අදියරේ ව්‍යුහාත්මක වැඩ කටයුතු 100%ක භෞතික ප්‍රගතියක් සහිතව අවසන් කරන ලදී. මින් ඉදිරි අදියරයන් තාවකාලිකව අත්හිටුවා තිබුණද, මෙම පදනම නිම කිරීම වර්ෂය තුළ ප්‍රාග්ධන සංවර්ධනයේ වැදගත් ජයග්‍රහණයකි.

2.6.8 අනුකූලතාවය සහ සහතිකකරණ සහය ශක්තිමත් කිරීම

යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) සහතිකකරණය, භූගෝලීය දර්ශක (GI) අනුකූලතා විගණන සහ ජාත්‍යන්තර ගුණාත්මක ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව අඛණ්ඩව පහසුකම් සපයන ලදී. මෙම පියවරයන් මගින් ශ්‍රී ලංකාවේ කුරුඳු සඳහා පවතින ජාත්‍යන්තර විශ්වසනීයත්වය සහ නිෂ්පාදනවල සුපරීක්ෂාභාවය තවදුරටත් තහවුරු විය.

2.7. ප්‍රධාන අභියෝග හා ඒවා අවම කිරීමට ගත් පියවර

2025 වර්ෂය තුළ වාර්තා වූ ධනාත්මක කාර්යසාධන දර්ශක මධ්‍යයේ වුවද, කුරුඳු අංශය ව්‍යුහාත්මක, මෙහෙයුම් සහ පාරිසරික අභියෝග රැසකට මුහුණ දුන්නේය. මෙම බාධක ඵලදායිතාව, ශ්‍රමිකයන්ගේ හිඟය, වෙළඳපොළ තරහකාරිත්වය සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි බලපෑම් ඇති කළේය. පවතින සම්පත් උපරිමයෙන් භාවිත කරමින් එම බලපෑම් අවම කිරීමට දෙපාර්තමේන්තුව පියවර ගන්නා ලදී.

2.7.1 ඵලදායිතාව ආශ්‍රිත බාධක

ජාතික නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 26,000ක් දක්වා ළඟා වුවද, ඒකක භූමි ප්‍රමාණයක සාමාන්‍ය අස්වැන්න තවමත් අපේක්ෂිත මට්ටමට වඩා අඩු අගයක පවතී. කුරුඳු වගාවන්ගෙන් සැළකිය යුතු ප්‍රමාණයක් ආර්ථික වශයෙන් ලාභදායී කාලසීමාව ඉක්මවා ගිය වයස්ගත වගාවන් වීම මීට ප්‍රධාන හේතුවකි. මීට අමතරව, නිර්දේශිත පැළ ඝනත්වය පවත්වා නොගැනීම සහ පිරිවැය ඉහළ යාම හේතුවෙන් නිර්දේශිත පොහොර භාවිතය සීමා වීම ද අස්වැන්න කෙරෙහි බලපා ඇත.

අවම කිරීමේ පියවර: හෙක්ටයාර 773ක් පමණ ආවරණය වන පරිදි භූමි ඵලදායිතාව ඉහළ නැංවීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. නැවත වගා කිරීමේ සහය, පාංශු සංරක්ෂණ උපදෙස් සහ ක්ෂේත්‍ර මට්ටමේ ව්‍යාප්ති සේවා ශක්තිමත් කරන ලදී.

2.7.2 පුහුණු සැකසුම් ශ්‍රමිකයන්ගේ හිඟය

පුහුණු කුරුඳු තලන්නන්ගේ හිඟය ක්ෂේත්‍රයේ ප්‍රධාන මෙහෙයුම් බාධකයකි. තරුණ පරපුර මෙම ක්ෂේත්‍රයට යොමු වීම අඩු වීම හේතුවෙන් අස්වනු නෙළීමේ චක්‍ර ප්‍රමාද වීම සහ ශ්‍රම පිරිවැය ඉහළ යාම සිදු වේ.

අවම කිරීමේ පියවර: GMP ප්‍රමිතීන් මත පදනම් වූ පුහුණු වැඩසටහන් 41ක් මගින් පුහුණු කුරුඳු තලන්නන් 532 දෙනෙකු බිහි කරන ලදී. මීට අමතරව සංවර්ධන අංශය මගින් දේශීය ශ්‍රමික කණ්ඩායම්වල තාක්ෂණික ධාරිතාව නැංවීමට කටයුතු කරන ලදී.

2.7.3 අයහපත් දේශගුණික තත්ත්වයන්

2025 වර්ෂයේ අග භාගයේ පැවති අධික වර්ෂාපතනය සහ ගංවතුර තත්ත්වයන් හේතුවෙන් ඇතැම් දිස්ත්‍රික්කවල වගාබිම්වලට හානි සිදු වූ අතර ක්ෂේත්‍ර අධීක්ෂණ කටයුතුවලට ද බාධා එල්ල විය.

<u>අවම කිරීමේ පියවර:</u> හානියට පත් ඉඩම් පුනරුත්ථාපනය සඳහා හඳුනාගත් අතර, දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන වගා ක්‍රම සහ ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ උපායමාර්ග කෙරෙහි අවධානය යොමු කරන ලදී.

2.7.4 පළිබෝධ සහ රෝග ව්‍යාප්තිය

කුරුඳු පැළ මැක්කා (Thrips) සහ සුදු මුල් රෝගය වගාවේ ගුණාත්මකභාවයට සහ අස්වැන්නට තවදුරටත් අභියෝගයක් වී ඇත.

<u>අවම කිරීමේ පියවර:</u> ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ (IPM) දැනුවත් කිරීමේ වැඩසටහන් තීව්‍ර කරන ලදී. ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය මගින් සිදු කරන ලද පර්යේෂණ ඇසුරින් උද්භිද විද්‍යාත්මක කෘමිනාශක සහ ප්‍රශස්ත දිලීර නාශක භාවිතය පිළිබඳ නිර්දේශ ලබා දෙන ලදී.

2.7.5 අගය එකතු කිරීම සහ තාක්ෂණය භාවිත කිරීමේ සීමාවන්

සැකසුම් ඒකක 56ක් සඳහා නවීකරණ සහය ලබා දුන්නද, තොග වශයෙන් කුරුඳු අපනයනය කිරීමට සාපේක්ෂව අගය එකතු කළ නිෂ්පාදන අපනයනය තවමත් අඩු මට්ටමක පවතී. ඉහළ ප්‍රාග්ධන අවශ්‍යතාව සහ වෙළඳපොළ තොරතුරු සීමිත වීම මෙයට ප්‍රධාන බාධක වේ.

<u>අවම කිරීමේ පියවර:</u> අගය වැඩි කළ කුරුඳු නිෂ්පාදන සැකසුම් උපකරණ, තෙල් නිස්සාරණ ඒකක සහ මධ්‍යම සැකසුම් මධ්‍යස්ථාන සඳහා මූල්‍ය ආධාර ලබා දීම 2025 වර්ෂයේදී පුළුල් කරන ලදී.

2.7.6 වෙළඳපොළ සංකේන්ද්‍රණය වීමේ අවදානම

ශ්‍රී ලංකාවේ කුරුඳු අපනයනය සීමිත ජාත්‍යන්තර වෙළඳපොළවල් කිහිපයක් මත පමණක් යැපීම හේතුවෙන් මිල උච්චාවචනයන්ගේ බලපෑමට ලක් වේ.

<u>අවම කිරීමේ පියවර:</u> නව වෙළඳපොළවල් කරා ප්‍රවේශ වීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම, සහතිකකරණ ක්‍රියාවලීන් සහ අපනයනකරුවන් ලියාපදිංචි කිරීමේ කටයුතු සඳහා දෙපාර්තමේන්තුව අඛණ්ඩව පහසුකම් සපයන ලදී. චීන මහජන සමූහාණ්ඩු වෙත කුරුඳු අපනයනය කිරීමට අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග සම්පූර්ණ කර චීනය වෙත කුරුඳු නිෂ්පාදන අපනයනය කිරීමට පහසුකම් සලසන ලදී.

2.7.7 ආයතනික සහ අයවැය බාධක

ප්‍රතිපාදන මුදා හැරීමේ ප්‍රමාදයන් සහ අනුමත කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු හේතුවෙන් වගා ව්‍යාප්ති සහ අධීක්ෂණ කටයුතු සැලසුම් කළ පරිදිම ක්‍රියාත්මක කිරීමට යම් බාධා එල්ල විය.

<u>අවම කිරීමේ පියවර:</u> ප්‍රමුඛතාවය මත පදනම් වූ වියදම් සැලැස්මක් අනුගමනය කරමින් අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීමට කටයුතු කරන ලදී.

2.7.8 "කුරුඳු ද්වාරය" ව්‍යාපෘතියේ ඉදිරි අදියරයන් අත්හිටුවීම

අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව මෙම ව්‍යාපෘතියේ දෙවන කොටස සහ දෙවන අදියර තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන්, එමගින් අපේක්ෂිත ප්‍රවර්ධන සහ සංචාරක ප්‍රතිලාභ ලබා ගැනීම තාවකාලිකව ප්‍රමාද වී ඇත.

<u>අවම කිරීමේ ප්‍රවේශය:</u> දැනට නිම කර ඇති ව්‍යුහාත්මක පද්ධති නඩත්තු කරමින්, ඉදිරි අයවැය අනුමැතිය මත පදනම්ව අදියර වශයෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි.

2.8.අනාගත දිශානතිය සහ ඉලක්ක

2025 වර්ෂය තුළ අත්කරගත් ප්‍රගතිය පදනම් කරගනිමින්, ඉදිරි වර්ෂයන්හිදී නිෂ්පාදන ධාරිතාව ශක්තිමත් කිරීම, ගුණාත්මක ප්‍රමිතීන් ඉහළ නැංවීම, අගය එකතු කිරීම ප්‍රවර්ධනය කිරීම සහ ආයතනික කාර්යක්ෂමතාව වර්ධනය කිරීම කෙරෙහි කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව අඛණ්ඩව අවධානය යොමු කරනු ඇත. දෙපාර්තමේන්තුවේ ඉදිරි ගමන් මග ජාතික ආර්ථික ප්‍රමුඛතා, අපනයන වර්ධන අරමුණු සහ කුරුඳු කර්මාන්තයේ දිගුකාලීන තිරසාරභාවය මත මෙහෙයවනු ලැබේ.

2.8.1 නිෂ්පාදන සහ අපනයන ඉලක්ක

ජාතික ආර්ථිකයට කුරුඳු ක්ෂේත්‍රයෙන් ලැබෙන දායකත්වය තවදුරටත් ඉහළ නැංවීම සඳහා දෙපාර්තමේන්තුව විසින් මධ්‍යකාලීන ඉලක්ක කිහිපයක් හඳුනාගෙන ඇත. ඒ අනුව 2026 වර්ෂය සඳහා පහත ඉලක්ක සපුරා ගැනීමට අපේක්ෂිතය:

- ජාතික නිෂ්පාදනය 2025 වර්ෂයේ වාර්තා වූ මෙට්‍රික් ටොන් 26,000 සීමාව ඉක්මවා වර්ධනය කිරීම.
- අපනයන පරිමාව මෙට්‍රික් ටොන් 20,500කට වඩා ඉහළ මට්ටමක පවත්වා ගැනීම.
- වෙළඳපොළ ප්‍රවේශය සහ අගය එකතු කිරීම හරහා අපනයන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 260 සීමාව ඉක්මවා ඉහළ නැංවීම.
- ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ සන්නාමකරණය (Branding) හරහා සාමාන්‍ය අපනයන මිල ඉහළ නැංවීම.

සැපයුම් පදනම ශක්තිමත් කිරීම සඳහා සාම්ප්‍රදායික මෙන්ම සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල ද වගා ව්‍යාප්තිය සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.

2.8.2 ඵලදායිතාව ඉහළ නැංවීම

හෙක්ටයාරයකින් ලැබෙන අස්වැන්න (ඵලදායිතාව) තවදුරටත් වර්ධනය කළ යුතු බැවින්, ඉදිරි මැදිහත්වීම් පහත අංශ කෙරෙහි යොමු කෙරේ:

- වයස්ගත වගාවන් නැවත වගා කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම.
- පාංශු සාරවත් බව කළමනාකරණය කිරීමේ පිළිවෙත් ශක්තිමත් කිරීම.
- 'ශ්‍රී ගැමුණු' සහ 'ශ්‍රී විජය' වැනි ඉහළ අස්වන්නක් ලබාදෙන ප්‍රභේද ප්‍රවර්ධනය කිරීම.
- ගොවීන් අතර නිර්දේශිත කෘෂිකාර්මික පිළිවෙත් පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම.

2.8.3 අගය එකතු කිරීම සහ සැකසුම් නවීකරණය ප්‍රවර්ධනය කිරීම

අගය එකතු කළ කුරුඳු නිෂ්පාදනවල කොටස ඉහළ නැංවීම ප්‍රධාන ප්‍රමුඛතාවයකි. ඒ සඳහා GMP ප්‍රමිතීන්ට අනුකූල සැකසුම් ඒකක පිහිටුවීම, තෙල් නිස්සාරණය සහ උසස් නිෂ්පාදන සූත්‍රගත කිරීම් ප්‍රවර්ධනය කිරීම මෙන්ම ජාත්‍යන්තර සහතිකකරණයන් (HACCP, ISO, GMP) ලබා ගැනීමට පහසුකම් සැලසීම සිදු කරනු ඇත.

2.8.4 වෙළඳපොළ විවිධාංගීකරණය සහ අපනයන ප්‍රවර්ධනය

සාම්ප්‍රදායික වෙළඳපොළවල් මත යැපීම අවම කිරීම සඳහා නැගී එන නව වෙළඳපොළවල් කරා ප්‍රවේශ වීම කෙරෙහි අවධානය යොමු කෙරේ. ජාත්‍යන්තර සෞඛ්‍යාරක්ෂිත ප්‍රමිතීන්ට (Phytosanitary) අනුකූල වීම සහ නිෂ්පාදනවල අනුරේඛීයතාව (Traceability) සහතික කිරීම මෙහිදී ප්‍රධාන වේ.

2.8.5 ආයතනික ශක්තිමත් කිරීම සහ පාලනය

ඉදිරි ආයතනික ප්‍රමුඛතාවයන් අතර අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම, වගාබිම් වාර්තා සහ අපනයනකරුවන්ගේ දත්ත පද්ධති ඩිජිටල්කරණය කිරීම සහ ISO 17025 රසායනාගාර ප්‍රතීතන විෂය පථය පුළුල් කිරීම ඇතුළත් වේ.

2.8.6 "කුරුඳු ද්වාරය" - අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගය

2025 වර්ෂයේදී අත්හිටුවන ලද "කුරුඳු ද්වාරය" ව්‍යාපෘතියේ ඉදිරි අදියරයන්, මූල්‍යමය වශයෙන් විචක්ෂණශීලී ප්‍රවේශයක් යටතේ අනාගත අමාත්‍ය මණ්ඩල අනුමැතියට සහ අයවැය ප්‍රතිපාදනවලට යටත්ව ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව අදහස් කරයි.

2.8.7 දිගුකාලීන උපායමාර්ගික රාමුවක් සකස් කිරීම

කුරුඳු කර්මාන්තය සඳහා වසර කිහිපයක් ආවරණය වන පරිදි පුළුල් උපායමාර්ගික රාමුවක් සකස් කිරීමේ කටයුතු දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කර ඇත. මෙම රාමුව මගින් ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා පැහැදිලි මාර්ග සිතියමක්, මැනිය හැකි කාර්යසාධන දර්ශක සහ පාර්ශ්වකරුවන් අතර ශක්තිමත් සම්බන්ධීකරණයක් අපේක්ෂා කෙරේ.

2.8.8 තිරසාර වර්ධනය සඳහා වූ කැපවීම

මධ්‍යකාලීන සහ දිගුකාලීනව දෙපාර්තමේන්තුව පහත කරුණු සහතික කිරීමට කැපවී සිටී:

- පරිසර හායනයකින් තොරව තිරසාර ලෙස කුරුඳු වගාව ව්‍යාප්ත කිරීම.
- සුලු පරිමාණ ගොවීන්ගේ ආදායම් මාර්ග ඉහළ නැංවීම.
- පර්යේෂණ සහ නවෝත්පාදන හරහා ජාත්‍යන්තර තරඟකාරිත්වය ශක්තිමත් කිරීම.
- "සැබෑ ලංකා කුරුඳු" නිෂ්පාදකයා ලෙස ශ්‍රී ලංකාව සතු ගෝලීය නායකත්වය තවදුරටත් රැක ගැනීම.

සංයුක්ත වගා කටයුතු, පර්යේෂණ, සැකසීම සහ වෙළඳාම යන සියලු අංශ ඔස්සේ සිදුකරන ඒකාබද්ධ මැදිහත්වීම් තුළින් කුරුඳු කර්මාන්තයේ ආර්ථික, සමාජීය සහ සංස්කෘතික වටිනාකම ඉහළ නැංවීම දෙපාර්තමේන්තුවේ අවසාන අරමුණයි.

නිර්දේශ කරමි.

L. M. J. K. Lindara
Director General (Acting)
Department of Cinnamon Development
Gunarathna Weerakoon Mawatha,
Borakanda, Karandeniya.

.....

එල්.එම්.ජේ.කේ. ලින්දර
අධ්‍යක්ෂ ජනරාල්
කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව

අනුමත කරමි.

.....


ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
උජමල්වත්ත පාර, බත්තරමුල්ල

පරිච්ඡේදය 03

2025 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය



2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය තත්ත්වයන්ගත ප්‍රකාශනය

අංකෙක්ෂිත අවසාන ප්‍රතිඵලය 2025 රු.		සටහන	තත්ත්ව 2025 රු.	2024 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	වාහනවල් මිල	1	-	-	
-	වැඩිමිය හා ගෙවීම් වන ගෙවීම්	2	-	-	අමාත්‍ය-1
-	ව්‍යාපෘතිවල ගෙවීම්වල මිල මිල	3	-	-	
-	මිල ගෙවීම් ආදායම් හා ගෙවීම්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් ගෙවීම් ලැබීම්		-	-	
-	ආයෝජනයේ වලිත		348,823,000	153,251,327	අමාත්‍ය-3
-	ණයවීම		135,051,058	34,521,012	අමාත්‍ය-4
10,000,000.00	පෞද්ගලික ගිණුම		4,326,645	1,298,422	අමාත්‍ය-5
-	ගෙවීම් පුරවා ලෙස ගිණුම් ලැබීම		-	-	
-	මුළු ආදායම් ගෙවීම් (ආ)		488,200,703	189,070,761	
	මුළු ආදායම් ලැබීම් හා ආදායම්				
-	ගෙවීම් ලැබීම් ඇ = (අ)+(ආ)		488,200,703	189,070,761	
	ආයෝජනයෙන් අල්ලෙස් (ආ)		-	27,794,697	
	ඉදිරි ආදායම් ලැබීම් සහ ආදායම්				
	ගෙවීම් ලැබීම් ඉ = (ඇ)-(ආ)		488,200,703	161,276,064	
	අඩු කළා : වියදම්				
	ප්‍රකාශවීමෙන් වියදම්		-	-	
102,990,000.00	වැටුප්, සේවකයා සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	98,685,172	63,691,106	
37,410,000.00	අනෙකුත් සංඝවට සහ සේවා	6	27,633,335	20,430,164	අමාත්‍ය-2(ii)
600,000.00	ඉහතකරන්, පුදාන සහ මිලදීගැනීම්	7	322,193	173,020	
-	ගෙවුම් ගෙවීම්	8	-		
-	වෙනත් ප්‍රකාශවීමෙන් වියදම්	9	-	-	
141,000,000.00	මුළු ප්‍රකාශවීමෙන් වියදම් (ඊ)		126,640,700	84,294,290	
	මූලධන වියදම්				
	මූලධන වෙනුවෙන් ප්‍රකාශවීමෙන් හා				
289,500,000.00	වැටිමිලු කිරීම්	10	20,336,464	2,961,941	
11,000,000.00	මූලධන වෙනුවෙන් අත්තර් කර ගැනීම්	11	70,527,380	66,161,666	
100,000,000.00	ප්‍රගතිය මාරුකිරීම්	12	93,346,425	-	අමාත්‍ය-2(i)
-	මූලධන වෙනුවෙන් අත්තර් කර ගැනීම්	13	-	-	
500,000.00	භාෂිකා වර්ධනය	14	265,000	220,615	
5,000,000.00	වෙනත් මූලධන වියදම්	15	4,944,148	-	
406,000,000.00	මුළු මූලධන වියදම් (උ)		189,419,416	69,344,222	
	ණයවලු ගෙවීම්		82,091,264	27,235,431	අමාත්‍ය-4
7,000,000.00	පෞද්ගලික ගෙවීම්		10,765,945	9,741,773	අමාත්‍ය-5
	වෙනත් ප්‍රධාන ලෙස ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙස වියදම් (ඌ)		92,856,309	36,977,204	
	මුළු වියදම් ඩ = (ඊ+උ+ඌ)		408,916,424	190,615,716	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඩ = (ඉ–ඩ)		79,284,279	(29,339,652)	
	අයිති ගැසුම් ප්‍රකාශනය අනුව ශේෂය		79,284,279	(29,339,652)	අමාත්‍ය-7
	දෙසැම්බර් 31 දිනට අයිති ශේෂය		-	-	අමාත්‍ය-3
			79,284,279	(29,339,652)	

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

එමස්-ඩී

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය


	සටහන	2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	එමස්-6	142,913,761	72,738,328
මූල්‍ය වත්කම්			
අත්කිකාරම් ණයකම්	එමස්-5/5(ඒ)	14,881,750	8,443,351
මුදල් හා මුදල් සමාන යු	එමස්-3	-	-
මුළු වත්කම්		157,795,511	81,181,679
සුද්ධ වත්කම් / හිමිකම්			
සංස්ථාගතය සවිත සුද්ධ වත්කම්		(45,363,625)	1,157,830
දේපළ පිරියත හා උපකරණ සංවිතය		142,913,761	72,738,328
ණයකම් හා වැට අත්කිකාරම් සංවිතය	**එමස්-5(ඒ)**	-	
වගකීම් වගකීම්			
තැන්පතු ණයකම්	එමස්-4	60,245,375	7,285,521
අදාළ වගකීම	එමස්-3	-	-
මුළු වගකීම්		157,795,511	81,181,679

මිටු අංක.....මිට ..... දක්වා එමස් 1 මිට එමස් 7 දක්වා වූ පාසලේ පසුවලින් ඉදිරියත් කෙරෙන ණයකම් කොටසකු සහ ගැනුණුම මිටු අංක ..... මිට ..... දක්වා ඇතුළත් ණයකම් වෙනත් විෂයන් ද මෙම වෙනත් ණයකරණයේ පත්තරවල කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන ඔළිගෙල ණයකම් රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ණයකම් අංකෙරින්දේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත.** ඉහත වෙනත් ණයකරණ සඳහන් කාරිය, මිට අදාළ ණයකම් වෙනත් හා දෙනකුත් ණයකම් කොටසකු හාණ්ඩාගාර ණයකම් වෙත් සමග සැසඳීම කර ඇති බවටත් ඒවා එම කාරිය සමග එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන ණයකරණ පනතේ 38 (1) (අ) වගන්තිය අනුව මූල්‍ය කටයුතු සඳහා වලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යාමකරණ කළමනාකරණ මූල සවිමින බවත් මූල්‍ය කටයුතු සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ වලදායීතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති වලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වගීන් වග කියාලෙන්නා සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණකාධිකාරී නිලධාරී	ගණකාධිකාරී නිලධාරී	ප්‍රාදේශීය ලේකම් නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/
නම :	නම :	අධ්‍යක්ෂ (මූල්‍ය)/ කොමසාරිස් (මූල්‍ය)
තනතුර :	තනතුර :	නම :
දිනය : 26.02.2026	දිනය :	දිනය : 2/24

3.3 මුදල් ප්‍රවාහ පිලිබඳ ප්‍රකාශය



2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2025 රු.	සංශෝධිත 2024 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	8,981,452	1,273,688
අග්‍රිම ලැබීම්	348,823,000	153,251,327
අත්තිකාරම් අයකර ගැනීම්	3,778,367	932,378
තැන්පතු ලැබීම්	135,051,058	34,521,011
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	496,633,877	189,978,404
අඩුකළා : මුදල් වැය කිරීම්		
සුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	112,553,637	38,808,496
සහනාධාර සහ මාරුකිරීම්	322,193	-
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	115,068,150	1,202,725
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	111,117,191	32,076,130
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම්	-	27,794,697
අත්තිකාරම් ගෙවීම්	6,991,709	1,416,523
තැන්පතු ගෙවීම්	82,091,264	27,235,431
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	428,144,143	128,534,002
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	68,489,734	61,444,402
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
තිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා හෙංචනික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	68,489,734	61,444,402
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	68,489,734	61,444,402
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(68,489,734)	(61,444,402)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	(0)	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

ඇමුණුම - (iv)

බැරකම් පිළිබඳ ප්‍රකාශනය - (i)

මු.ගෙ.94 (2) සහ (3) ප්‍රකාරව බැරකම්වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශනය

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය: 337
වැඩසටහන් අංකය හා නාමය: 2 සංවර්ධන වැඩසටහන

සුද්ගලයාගේ/ආයතනයේ නම	බැඳීම පිළිබඳ විස්තරය	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය	මු.ගෙ. 94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව (රු.)	මු.ගෙ. 94(3) අනුව මුළු පිටිවැය ඇස්තමේන්තුව (රු.)	බැඳීම් හා බැරකම් වටිනාකම (රු.)
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු								
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගම්පහ	කාර්යාල ඉඩ පහසුකම් ලබා ගැනීම	337	2	1	1404	1,160,761.10		21,660.00
එකතුව								21,660.00
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල								
Sri Lanka Telecom	දුරකථන නිල්පත් ගෙවීම	337	2	1	1402	110,823.60		34,199.00
Ceylon Electrical	විදුලි බිල්පත් ගෙවීම	337	2	1	1403	325,202.73		61,873.70
එකතුව								96,072.70
3. වෙනත් (පෞද්ගලික අංශය)								
Matara Motors	වාහන ශ්‍රේවා කිරීම	337	2	1	1301	23,440.35		138,470.00
Hasindu Service Centre	කැබ රථයේ වාර ශ්‍රේවාව සිදුකිරීම	337	2	1	1301	23,440.35		42,835.00
Office Network Pvt Ltd	පැක්ස් යන්ත්‍රය අළුත්වැඩියා කිරීම	337	2	1	1302	61,750.58		12,980.00
Atlanta Scientific Pvt Ltd	විද්‍යාගාර උපකරණ මිලදී ගැනීම	337	2	1	2507	55,852.13		158,000.00
E Link Solutions	වයරලස් මවුස් මිලදී ගැනීම	337	2	1	1205	994,862.18		4,500.00
E Link Solutions	පරිගණක යන්ත්‍රය අළුත්වැඩියා කිරීම	337	2	1	1302	61,750.58		24,400.00
Sumudu Offset Printers & Publishers Pvt Ltd	අත්පත්‍රිකා මුද්‍රණය කිරීම	337	2	1	1205	994,862.18		72,400.00
Marlbo Trading Company	PH මීටරිස් මිලදී ගැනීම	337	2	1	2103	77,735.00		578,719.20
C.U. Vidanapathirana & Others	ගමන් වියදම් ගෙවීම	337	2	1	1401	53,426.00		800.00
H.Y.K. Gunasinghe & Others	ගෙවීම	337	2	1	1402	110,823.60		11,973.62
B.S.N. Kumari & Others	ගමන් වියදම් ගෙවීම	337	2	1	1101	47,056.31		9,775.00
O.P.R. Jayanthi & Others	සංවර්ධන වියදම්	337	2	1	2202	6,653,575.19		5,349,750.00
S.S. Hewagama & Others	අනිකාල දීමනා ගෙවීම	337	2	1	1002	0.00		49,005.10
එකතුව								6,453,607.92
මුළු එකතුව								6,571,340.62

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමිසාරිස් (මුදල්)
දිනය : 2/24

එම්.පී.ගිමිණි ජයසේන
ගණකාධිකාරි
අධ්‍යක්ෂ ජේතරාල් වෙනුවට
කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තු

ඇමුණුම - (v)

බැරකම් පිළිබඳ ප්‍රකාශනය - (ii)

මු.ගෙ.215 (3) (ආ) සහ (ඇ) ප්‍රකාරව තැන්පත් ගිණුමට මාරු කරන ලද ප්‍රතිපාදන

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය: 337
වැඩසටහන් අංකය හා නාමය: 2 සංවර්ධන වැඩසටහන

සුද්ගලයාගේ/ආයතනයේ නම* (ප්‍රතිපාදන මාරු කරන පිට හඳුනාගෙන තිබිය යුතුය)	වගකීම් පිළිබඳ විස්තරය	ණයවර ලිපි අංක ආදිය	ප්‍රතිපාදන මාරු කරනු ලැබුවේ කුමන වැය ශීර්ෂයකින්ද				කැන්පතු ගිණුම් අංකය	මාරුකරන ලද මුදල රු.
			ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය		
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු								
.....	නිස් වාර්තාවකි							XX
.....								XX
එකතුව								
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල								
.....								XX
.....								XX
එකතුව								
3. වෙනත් (පෞද්ගලික අංශය)								
.....								XX
.....								XX
එකතුව								
මුළු එකතුව								

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමිසාරිස් (මුදල්)
දිනය : 2/24

එම්.පී.ගිමිණි ජයසේන
ගණකාධිකාරි
අධ්‍යක්ෂ ජේතරාල් වෙනුවට
කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තු

* නම් වර්ගීකරණ ආයතනයට අදාළ නම් පමණක් ආකෘතිය භාවිත කළ යුතු ය.

47

ඇමුණුම - (i)

පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය
(මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ වන පාඩු)

වියදම් ශීර්ෂ අංකය: 337 අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව
වැඩසටහන් අංකය හා නාමය : 2 සංවර්ධන වැඩසටහන

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම්/කපාහැරීම්/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

අගය		සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු 25,000.00	අඩු		
රු 25,000.01	වැඩි		
එකතුව			

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1		
2 හිස් වාර්තාවකි		
3		
4		
එකතුව		

(ii) කවදූරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනය

අගය		සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු 25,000.00	අඩු		
රු 25,000.01	වැඩි		
එකතුව			

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1		
2		
3		
4		
එකතුව		

(ii) අනුව කාල විශ්ලේෂණය

වසර 5 ට අඩු	සිද්ධි සංඛ්‍යාව	
	ගණන	රු
වසර 5-10	සිද්ධි සංඛ්‍යාව	
	ගණන	රු
වසර 10 ට වැඩි	සිද්ධි සංඛ්‍යාව	
	ගණන	රු

සටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මු.රෙ. 106 යටතේ වන හානි හා මු.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

.....
ප්‍රධාන මූල්‍ය-නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමිසාරිස් (මුදල්)
දිනය : 2/24

* කම වාර්තාකරණ ආයතනයේ මෙම වාර්තාවලට අදාළව කොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

එම්.පී.හිමේෂා ජයසේන
ගණකාධිකාරි
අධ්‍යක්ෂ ජේනරාල් වෙනුවට
කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තු

ඇමුණුම -(ii)

පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 337 අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව
වැඩසටහන් අංකය හා නාමය: 2 සංවර්ධන වැඩසටහන

1 වර්ෂය තුළ සිදුවූ මු.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

	අගය	සිද්ධි සංඛ්‍යාව		වටිනාකම (රු)
(i)	රු. 25,000.00 අඩු	.....	.....	....
(ii)	රු. 25,000.01 වැඩි	.....	.....	....
	එකතුව			

2 වර්ෂය තුළ මු.රෙ. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශනය

අලාභයේ ස්වභාවය	ආරම්භක කපා නොහැල ශේෂය රු.	අලාභයේ වටිනාකම රු.	අයකර ගැනීම් රු.	පොතෙන් කපා හල අගය රු.	කපා නොහැල ඉදිරියට ගෙනයන ශේෂය රු.	පොතෙන් කපා හැරීම් සඳහා වූ අනුමැතියේ යොමු අංකය
1 හිස් වාර්තාවකි						
2						
3						
4						
5						
6						
එකතුව						

සටහන - සටහන (i) හි ඇතුළත් ගිණුම්ගත කළ යුතු පාඩු හා අත්හැරීම් හැර මු.රෙ. 109 යටතේ වන අනෙකුත් පාඩු හා අත්හැරීම් පමණක් මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතු ය.

.....
ප්‍රධාන මූල්‍යාණ්ඩුධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමිසාරිස් (මුදල්)
දිනය : 2/24

* කම වාර්තාකරණ ආයතනයේ මෙම වාර්තාවලට අදාළව කොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

එම්.පී.හිමේෂා ජයසේන
ගණකාධිකාරි
අධ්‍යක්ෂ ජේනරාල් වෙනුවට
කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තු

ඇමුණුම - (vi)

ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පිළිබඳ ප්‍රකාශනය

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය : 2 සංවර්ධන වැඩසටහන

		රු.
(1)	ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර යටතේ, පරිපූරක වෙන්කිරීම්ද ඇතුළුව 2025 ඇස්තමේන්තුගත වෙන්කිරීම්	ඕස් වාර්තාවකි
(2)	ඉහත (1) ට අදාළ 2025 වර්ෂය තුළදී දරන ලද මුළු වියදම්	.....
(3)	2025 ජනවාරි 01 දිනට ලැබීමට නියමිත තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව	.....
(4)	2024 හා ඊට පෙර වර්ෂවලට අදාළව, 2025 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව (ඇත්නම්)	.....
(5)	2025 වර්ෂය සම්බන්ධයෙන් 2025 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව	.....
(6)	2024 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් වූ හිමිකම්පෑම් සම්බන්ධයෙන් 2025 වර්ෂයේදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පැමිවල එකතුව	.....
(7)	2025 වර්ෂය සම්බන්ධයෙන් 2025 වර්ෂය තුළදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පැමිවල එකතුව	.....
(8)	2024 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් 2025 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල මුළු එකතුව	.....
(9)	2025 වර්ෂය වෙනුවෙන් 2025 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල එකතුව	.....
(10)	2025 දෙසැම්බර් 31 දිනට ලැබීමට නියමිතව තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව {(3+4+5) - (6+7) } - (8+9)	.....
(11)	මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2025 වර්ෂය සම්බන්ධයෙන් 2025 දෙසැම්බර් 31 දිනෙන් පසුව කරන ලද ප්‍රතිපූරණය කළ හැකි	.....
(12)	මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2025 දෙසැම්බර් 31 දිනෙන් පසුව ලැබුණු ප්‍රතිපූරණවල එකතුව	.....
(13)	මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කරන ලද දිනට ලැබීමට නියමිතව ඇති ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පැමිවල එකතුව (10 + 11 - 12)	.....

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/අධ්‍යක්ෂ (මුදල්) / කොමසාරිස් (මුදල්)
දිනය 2/24

එම්.පී.තිලෙකා ජයසේන
ගණකාධිකාරි
අධ්‍යක්ෂ ජෙනරාල් වෙනුවට
කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තු

* තම වාර්තාකරණ ආයතනයට අදාළ නම් පමණක් ආකෘතිය භාවිත කළ යුතු ය.

ඇමුණුම - (vii)

අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශනය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය: 337

වැඩසටහන් අංකය හා නාමය: 2 සංවර්ධන වැඩසටහන

දිනය	වවුචර් අංකය	ආදායකයාගේ නම	ගෙවීමේ ස්වභාවය	ගණන (රු)
		ඕස් වාර්තාවකි		

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය: 2/24

එම්.පී.තිලෙකා ජයසේන
ගණකාධිකාරි
අධ්‍යක්ෂ ජෙනරාල් වෙනුවට
කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තු

* තම වාර්තාකරණ ආයතනයේ මෙම වාර්තාවලට අදාළව කොරතුරු නොමැති අවස්ථාවල ඕස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

3.5 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. SPCG/GL/C/DCD/FA/2025
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2026 මැයි 18 දින.

Received
20 MAY 2026
Department of Cinnamon Development

අධ්‍යක්ෂ ජනරාල්,
කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව,
කරන්දෙණිය.

ශීර්ෂය 337- කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යටෝක්ත වාර්තාව සහ පරීක්ෂා කරන ලද මූල්‍ය ප්‍රකාශන මේ සමඟ ඉදිරිපත් කරමි.

එම්.පී. මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය.

එම්.පී. මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත:- 1. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය, කොළඹ-1
2. ලේකම් - කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. SPCG/GL/C/DCD/FA/2025 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2026 මැයි 18 දින

අධ්‍යක්ෂ ජනරාල්,
කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව,
කරන්දෙණිය.

ශීර්ෂය 337 - කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 337 - කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය නත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම් උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ නත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම් වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.5.1 මූල්‍ය නොවන වත්කම්

2024 ජනවාරි 24 දිනැති අංක අමප/24/0089/612/008 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කුරුඳු පර්යේෂණ සහ පුහුණු මධ්‍යස්ථානය, කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරා තිබුණ ද එහි වත්කම්, ඉන්වෙන්ට්‍රි අයිතම මෙම වාර්තාවේ දිනය දක්වා දෙපාර්තමේන්තුවේ ගිණුම්වලට ඇතුලත් කර නොතිබුණි.

1.5.2 තැන්පතු ගිණුම් ශේෂ

ව්‍යාපෘති රැඳවුම් මුදල්, තැන්පතු ගිණුම් මගින් පවත්වාගෙන ගියද, ප්‍රධාන කාර්යාලය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියට අදාළ රු.152,299ක රැඳවුම් මුදල සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත වී තිබූ බැවින් තැන්පත් ගිණුමේ ශේෂය එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

1.5.3 ලේඛන හා පොත්පත් පවත්වා නොගැනීම

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළ මුදල් රෙගුලාසි 452 හා 214 අනුව පවත්වාගෙන යා යුතු විගණන විමසුම් ලේඛනය හා බැරකම් පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබූ බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

02. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1 (අ) II	එළඹෙන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැකසීමට පෙර අදාළ වන්කම් නිවැරදිව තක්සේරු කර ප්‍රාග්ධනිත කළ යුතු වීම.	1.5.1

03. මූල්‍ය සමාලෝචනය

3.1 අග්‍රිම කළමනාකරණය

2025 වර්ෂයේ වියදම් සඳහා ප්‍රතිපාදන තිබූ නමුත් අග්‍රිම නිසි පරිදි කළමනාකරණය නොකිරීම හේතුවෙන් රු.5,486,490 ක බැඳීම්වලට එළඹ තිබූ බව නිරීක්ෂණය විය.

3.2 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික කුරුඳු පර්යේෂණ සහ පුහුණු මධ්‍යස්ථානය සතු අක්කර 21 භූමියේ අක්කර 7ක පමණ කුරුඳු වගාවට අදාළ අස්වනු නෙළීම පිළිබඳ සැලැස්මක් සකස්කර නොතිබුණි.

(ආ) පර්යේෂණ වගා කොටසින් ලැබෙන කුරුඳු නිෂ්පාදන කාලීනව හා අවස්ථානුකූලව වෙළඳපොලට යොමු නොකිරීම හේතුවෙන් කුරුඳු පතුරු, කුරුඳු කුරු, කුරුඳු කුඩු කිලෝග්‍රෑම් 337 ක් සහ කුරුඳු කොළ තෙල් ලීටර් 15

ක් මාස 06 ට වැඩි කාලයක් ගබඩාවේ රඳවා තිබූ අතර එමඟින් ගුණාත්මකභාවය පහළ යාම, නාස්තිය, වටිනාකම් අඩු වීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය.

3.3 වියදම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ, පුනරාවර්තන වැය විෂයයන් 16 ක එකතුව රු.13,392,328 ක ප්‍රතිපාදන ප්‍රමාණයක්ද, ප්‍රාග්ධන වැය විෂයයන් 7 ක එකතුව රු.209,708,499 ක ප්‍රතිපාදන ප්‍රමාණයක්ද ඉතිරිව පැවතුණි. ඒ පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) පුනරාවර්තන වැය විෂයයන් 16 කට අදාළව ප්‍රතිපාදන ඉතිරි වීම සියයට 11 සිට 90 දක්වා වූ ඉහළ පරාසයක පැවති අතර ප්‍රාග්ධන වැය විෂයයන් 07 කට අදාළව ප්‍රතිපාදන ඉතිරිවීම සියයට 18 සිට සියයට 100 දක්වා වූ ඉහළ පරාසයක විහිදී පැවතුණි.

(ආ) 2016 වැය විෂය යටතේ දෙපාර්තමේන්තුවේ "යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සහතිකකරණ ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීමේ මෘදුකාංගය" සංවර්ධනය සඳහා වෙන්කර තිබූ රු.මිලියන 3 ක ප්‍රතිපාදනය භාවිතයට නොගෙන ඉතිරිව තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව සැලසුම් කළ පරිදි වැඩසටහන ක්‍රියාත්මක කළ නොහැකි වූ අවස්ථාවලදී අදාළ ප්‍රතිපාදනය සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) 2015 වැය විෂය යටතේ රු.මිලියන 01 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර, මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් යටතේ තවත් රු.මිලියනයක් ලෙස රු.මිලියන 02 ක් ප්‍රතිපාදන වෙන් කර තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ වියදම් රු.342,524 ක් පමණක් බැවින් ප්‍රතිපාදනයෙන් සියයට 83 ක් ඉතිරිව පැවතුණි. ඒ අනුව මෙකී වැය විෂය සම්බන්ධව කටයුතු කිරීමේ දී නිවැරදි ඇස්තමේන්තු ප්‍රතිපාදන කළමනාකරණයක් සිදුකර නොතිබූ බව නිරීක්ෂණය විය.

3.4 බැරකම් සහ බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරණ රාජ්‍ය ගිණුම් වක්‍රලේඛය අනුව, ප්‍රතිපාදන සීමාව තුළ බැරකම් සඳහා බැදීම් ඇති කළ යුතු වුවත්, 1301 වැය විෂයේ ප්‍රතිපාදන රු.23,440 ක් පමණක් ඉතිරිව තිබියදී වාහන සේවා කිරීමේ වියදම් සඳහා රු.138,470 ක් බිල්පත් ගෙවීමට අත ඉතිරිව තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත්ව තිබූ ඇමුණුම (iv) බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ, මුදල් රෙගුලාසි 94(2) සහ (3) ප්‍රකාරව බැදීම් එකතුව රු.6,571,340 ක් ලෙස දක්වා තිබුණද, භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එම එකතුව රු.8,961,105 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් 2025 දෙසැම්බර් 31 දිනට රු. 2,389,765 ක වෙනසක් නිරීක්ෂණය විය.

3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති රීති, රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
i. මුදල් රෙගුලාසි 225	කුරුැඳු පැළ ලබාදීමේ වැඩසටහනට අදාළ පොදු නැන්පතුවෙන් ගෙවීම් සඳහා නියමිත පොදු 70 ආකෘතිය භාවිතා කළ යුතු වුවද පොදු 35 ආකෘති පත්‍ර භාවිතා කර ගෙවීම් කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

ii.	මුදල් රෙගුලාසි 237(ඉ)(i)(iii)	නිලධාරීන්ගේ ශේෂ වැටුප පරීක්ෂා කර සහතික කරන නිලධාරියා වැටුප් ලේඛනයේ කෙටි අත්සන යොදා නොතිබුණ අතර, වැටුප් වර්ධක දින සඳහන් කිරීමටද කටයුතු කර නොතිබුණි.
iii.	මුදල් රෙගුලාසි 238(5)	i. රාජ්‍ය සේවකයින්ගේ ශුද්ධ වැටුප සහ චේතනයෙන් කොටසක් ගෙවීම ඔහු/ඇය නමින් ඇති බැංකු ගිණුම් දෙකකට සීමා විය යුතු නමුත් නියැදි පරීක්ෂාවේ දී බැංකු ගිණුම් 02කට වැඩි අවස්ථා 02ක් නිරීක්ෂණය විය. ii. මාසික වැටුප් සඳහා නිලධාරීන් පසිසටහන් පත්‍රයේ අත්සන් තබා ඇති බවට වැටුප් ගෙවන නිලධාරියා විසින් තහවුරු කර නොගත් අවස්ථා නිරීක්ෂණය විය.
iv.	මුදල් රෙගුලාසි 245(1),260(1)	එකතුව රු.162,159 ක් වූ ගෙවීම් වවුවර්පත් 05 ක් සඳහා වියදම් සහතික කිරීම, ලබාගන්නාගේ අත්සන නොමැති වීම සහ නිර්දේශය නොමැතිවීම් නිරීක්ෂණය විය.
v.	මුදල් රෙගුලාසි 261(1)	ගෙවීම් මුදල් පොතේ අනුක්‍රමික අංක සටහන් කර වවුවර්වලටද එම අංක යෙදිය යුතු වුවද එසේ සිදු කර නොතිබුන අතර, වැටුප් වවුවර් භෞතික ගොනුවට ඇතුලත් නොවීම හා ගොනු අංකකරණය විධිමත්ව සිදු කර නොතිබුණි.
(ආ)	ජාතික අයවැය වක්‍රලේඛ 03/2022	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පුද්ගලික නිවසක මාසිකව රු.300,000 ක බදු ගිවිසුමක් යටතේ පවත්වාගෙන යාම, සහ 2025 වසරේ දී එම නිවසේ අමතර ඉදිකිරීම් සඳහා රු.මිලියන 1.5 වියදම් දරා තිබුණි.

(ඇ) 2019 ජූලි 01 දින දේශීය ආදායම් කොමසාරිස්ගේ අංක CGIR/2019/03-1(Inslcir) චක්‍රලේඛය

සැපයුම්කරුවන්ගේ එකතු කළ අගය මත බදු ගෙවීම් තොරතුරු ඊළඟ මාසයේ 15 වන දිනට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට දන්වා යැවිය යුතු වුවද, 2025 වර්ෂයේ ගෙවන ලද රු. 18,987,726 එකතු කළ අගය මත බදු පිළිබඳ විස්තර සමාලෝචිත වර්ෂයේ නොයැවීම හේතුවෙන් රාජ්‍ය ආදායම් ප්‍රමාද වී ලැබෙන බවත්, රජයට ලැබිය යුතු මුදල් වෙනත් පුද්ගලයන් අත රඳවා ගෙන සිටිය හැකි අවදානමක් නිරීක්ෂණය විය.

3.6 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව අතුරු අග්‍රිම ලබාගත් කාර්යය අවසන් කර දින 10 ක් තුළ පියවීමට කටයුතු කළ යුතු වුවත්, අවස්ථා 04 කදී ලබා ගත් රු.363,000 ක මුදල පියවීමට දින 21ත් 26ත් අතර කාලයක් ලබා තිබුණ බව නිරීක්ෂණය විය.

(ආ) අග්‍රිම නිකුත් කිරීමට ප්‍රථමව නිවැරදි වියදම් ඇස්තමේන්තුවක් පිලියෙල කර එය විධිමත් පරිදි අනුමත කළ යුතු වුවද, අයි ඇස්තමේන්තු මත තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම නිසා අවස්ථා 14 කදී රු. 300,385 ක් වැඩිපුර ගෙවා තිබුණි.

3.7 තැන්පතු

කුරුඳු පැළ ලබාදීම වෙනුවෙන්, ප්‍රතිලාභියාගේ දායකත්වය පොදු තැන්පත් ගිණුමට ඇතුලත් කර තිබුණද 2026 ජනවාරි 01 දිනට එම ගිණුමේ ශේෂයට අදාළ කේවල ශේෂයන් නිවැරදිව තහවුරු කර නොතිබුණු අතර, පොදු තැන්පත් ගිණුමෙන් මුදල් ගෙවීමේදී ප්‍රතිලාභි දායකත්වය නිවැරදිව නිදහස් නොකර මුදල් වැය ලෙජරයෙන් නිදහස් කිරීම හේතුවෙන් 2025 දෙසැම්බර් 31 දිනට පැවති රු.53,025,294 ක් වූ තැන්පතු ගිණුමේ ශේෂය සහ රු.6,653,575 ක් වූ 2202 වැය විෂයයේ ශේෂය නිවැරදි නොවූ බව නිරීක්ෂණය විය.

04. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව තුළ කුරුඳු හා කුරුඳු ආශ්‍රිත නිෂ්පාදන සඳහා විශේෂ අලෙවි ප්‍රවර්ධන අංශයක් නොතිබීම හේතුවෙන් දේශීය විදේශීය වෙළඳපොල හඳුනාගැනීම, වෙළඳ විශ්ලේෂණය, ප්‍රවර්ධන වැඩසටහන් හා අපනයන අවස්ථා සංවර්ධනය වැනි කටයුතු සීමා වී තිබුණි. එමඟින් කුරුඳු කර්මාන්තයේ තරහකාරීත්වය, අපනයන ආදායමට සහ වෙළඳපොල අගය වැඩි කිරීමේ හැකියාව මන්දගාමී වී තිබුණි.

(ආ) කුරුඳු වගා භූමි ප්‍රමාණය, නිෂ්පාදනය, අපනයන ප්‍රමාණය, ගොවීන්ගේ ලියාපදිංචි තොරතුරු හා වෙළඳපොල මිල දත්ත ආදිය සම්පූර්ණ දත්ත පද්ධතියක් කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යෑම සිදුකර නොතිබූ බැවින් නිවැරදි සත්‍ය දත්ත මත පදනම් වූ සැලසුම් කිරීම්, ප්‍රතිපත්ති තීරණ ගැනීම සහ කර්මාන්ත ප්‍රගතිය නිවැරදිව මැන බැලීම සීමා වී තිබුණි.

(ඇ) ජාතික මට්ටමින් කුරුඳු නිෂ්පාදනය වැඩි කිරීම සඳහා වගා භූමි ව්‍යාප්තිය හා ඵලදායීතාව ඉහළ නැංවීමට අවශ්‍ය සැලසුම්ගත ක්‍රියාමාර්ග ප්‍රමාණවත් හා සතුටුදායී ලෙස ක්‍රියාත්මක කර නොතිබුණි. උසස් රෝපන ද්‍රව්‍ය බෙදා හැරීම, නව තාක්ෂණික හා පුහුණු වැඩසටහන්, පරණ වගා ප්‍රතිස්ථාපනය, පස් පරීක්ෂණය, පොහොර කළමනාකරණය හා නිසි අස්වනු නෙලා ගැනීම ප්‍රවර්ධනය කිරීම සීමා වී තිබුණි. ඒ අනුව ගාල්ල දිස්ත්‍රික්කයේ සමස්ත නිෂ්පාදනයෙන් සියයට 41 ක් ලබා ගැනීම සහ අනෙකුත් දිස්ත්‍රික්ක අතර අස්වැන්නේ සැලකිය යුතු විචලනයක් ඇති බව නිරීක්ෂණය වේ.

(ඈ) සමාලෝචිත වර්ෂයේ කුරුඳු වගා ප්‍රවර්ධනය, පර්යේෂණ සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු. මිලියන 189 ක් වැය කර ඇත. එය 2025 වර්ෂයේ මුළු කුරුඳු අපනයන ආදායමෙන් සියයට 0.23 ක් වන අතර මෙය ආර්ථික වැදගත්කම අනුව ප්‍රමාණවත් මට්ටමක සිදු වී ඇති බව නිරීක්ෂණය නොවේ. මෙම අඩු ආයෝජන තත්ත්වය දිගු කාලීන සංවර්ධන ඉලක්ක සපුරා

ගැනීමට ප්‍රමාදයක් ඇති කරන අතර එම ප්‍රමාදයට හේතු වශයෙන් වාර්ෂික සැලසුම් සකස් කිරීමේදී තාත්වික සංවර්ධන යෝජනා ඉදිරිපත් නොවීම සහ ප්‍රමාණවත් මානව සම්පත් නොමැති වීම හේතු වී තිබුණි.

4.2 ප්‍රසම්පාදනයන්

කුරුඳු වගාවන්හි ඵලදායිතාවය වැඩි කිරීමේ වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 5,299 කට රු.මිලියන 309.89 ක කුරුඳු පැළ මිලියන 10 ක් ලබාදී තිබුණද, පැළ මිලදී ගැනීමේ දී ප්‍රතිලාභියාගේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන තරහකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු නොකිරීම හේතුවෙන් තරහකාරී වාසි ලබා ගැනීමට නොහැකි වී තිබුණි. තවද මෙම වැඩසටහන සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ දී ගොවි සංවිධානවල සහභාගිත්වය ලබා ගෙන නොතිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික කුරුඳු පර්යේෂණ සහ පුහුණු මධ්‍යස්ථානය සතු අක්කර 21 කින් යුතු භූමියෙන් කුරුඳු වගාවට භාවිතයට ගෙන ඇති ප්‍රමාණය අක්කර 7ක් පමණක් බව නිරීක්ෂණය විය. මෙම ඉඩමේ අක්කර 07 කට ආසන්න භූමිය ගොඩනැගිලි හා පාරවල් සඳහා වෙන්කර ඇති බව සඳහන් කලද, එය සනාථ කරන ලේඛන නොමැති අතර, අක්කර 03 කට ආසන්න භූමිය කැලෑවට අත්හැර දමා ඇත. වගාකර නොමැති පාලු භූමිය ලෙස සලකන අක්කර 4 ක් පමණ භූමි ප්‍රදේශයේ කුරුඳු පදුරු 14,000 කට ආසන්න ප්‍රමාණයක් වගා කිරීමට හැකියාව තිබුණද, ඒ සඳහා නිසි සැලැස්මක් හෝ ක්‍රියාමාර්ග ගෙන නොතිබීම හේතුවෙන් භූමියේ සම්පූර්ණ ප්‍රයෝජනය ගෙන නොමැති බැවින් අස්වැන්න හා ආදායම් අඩු වී ඇති බව නිරීක්ෂණය වේ.

(ආ) පුහුණු මධ්‍යස්ථානය සතු අක්කර 21 ක භූමි ප්‍රදේශයේ විශාල කොටසක් වල් බිහිවී පාලු තත්ත්වයට පත්ව තිබූ අතර කම්කරුවන් 18 ක් සේවයේ යෙදී සිටියද භූමිය නඩත්තුව සතුටුදායක නොවන බව නිරීක්ෂණය විය. පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයක් ලෙස භූමිය ආදර්ශමත් කුරුඳු වගාවක් ලෙස සංවර්ධනය කළ යුතු වුවද, පාළු තත්ත්වය හේතුවෙන් මෙම කුරුඳු වගාව සාර්ථකව සිදු නොවී පවතින බව ද නිරීක්ෂණය විය.

(ඇ) සිනමන් ගේට් ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ රු. මිලියන 132 ක වියදමින් ගොඩනැගිල්ලේ සැකිල්ල ඉදිකර තිබුණද, දෙවන අදියර සඳහා ප්‍රතිපාදන නොමැතිව වසරකට ආසන්න කාලයක් එහි ඉදිකිරීම් අතරමඟ නවතා දමා තිබුණි. ව්‍යාපෘතිය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයක් හෝ දිගු කාලීන බදු පදනමක් යටතේ ඉදිරියට ගෙන යාමට 2025 අගෝස්තු 18 දින අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණද, 2026 මාර්තු වන තෙක් එය ක්‍රියාත්මක කර නොතිබුණි. මෙම ඉදිකිරීමට අදාළ භූමිය පින්නදුවේ සංචාරක ආකර්ෂණය සහිත ස්ථානයක පිහිටා තිබියදීත් එහි වාසිය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. මෙම ගොඩනැගිල්ල දිගු කාලීන භාවිතයෙන් තොරව පවතින බැවින් කොන්ක්‍රීට් ව්‍යුහය දිරාපත් වීමේ හා අනාගත ප්‍රතිසංස්කරණ වියදම් වැඩිවීමේ අවධානමක් පවතින බවද නිරීක්ෂණය විය.

(ඈ) අක්මීමණ ප්‍රාදේශීය ලේකම්ට අයත් සිනමන් ගේට් ව්‍යාපෘතියේ පළමු අදියර ක්‍රියාත්මක කර තිබූ අක්කර 03ක ඉඩම, 2026 මාර්තු දක්වා දෙපාර්තමේන්තුව වෙත පවරා ගෙන නොතිබුණි.

4.4 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

රු.මිලියන 132 ක වියදමින් ක්‍රියාත්මක කළ සිනමන් ගේට් ව්‍යාපෘතියේ කටයුතු සම්බන්ධයෙන් රු.මිලියන 60.2ක ගෙවීම් හා සිදුකල කාර්යයන් සම්බන්ධ නොගැලපීම් නිරීක්ෂණය විය. මෙහිදී රසායනික ද්‍රව්‍ය භාවිතා කර කලු ගල් ලිහිල් කිරීම සඳහා රු.මිලියන 14 ක්, ලිහිල් කළ ගල් ඉවත් කිරීම සඳහා රු.මිලියන 4.2 ක් සහ පස් මිලදී ගැනීම සඳහා රු.මිලියන 03 ක් ගෙවා තිබුණද වැඩ බිමේ පවතින තත්ත්වය, එම ප්‍රමාණය හා ගෙවීම් කිරීම අතර සමානතාවයක් නොපෙනුණි. තවද රෙඩ් මික්ස් කොන්ක්‍රීට් සඳහා රු.මිලියන 25 ක් ගෙවා තිබුණද, කොන්ක්‍රීට් සඳහා ඇතැම් විට වැඩබිමේ සැකසූ කොන්ක්‍රීට් භාවිතා කර තිබීම සහ හැඩයම් වැඩ (Formwork) සඳහා රු.මිලියන 08 ක් ගෙවීම් කර තිබුණද ඉදිකිරීම් නිමාව අපේක්ෂිත ගුණාත්මක තත්ත්වයේ නොවීම නිරීක්ෂණය විය. එසේ වුවද අධීක්ෂණය සඳහා රු.මිලියන 2.3 ක් ගෙවීම් කර තිබුණි. විදුලිය සඳහා රු.මිලියන 1.7 ක්, ජලය සඳහා රු.මිලියන 0.8 ක්, පළංචි සඳහා මිලියන 0.5 ක් සහ බිල්පත් ප්‍රමාදවීම් පොලිය වශයෙන් රු.මිලියන 0.7 ක් ගෙවා තිබුණද ඒ සඳහා ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් නොවිය. තවද ඇස්තමේන්තු සකස් කිරීමේදී දකුණු පළාත් මිල ගණන් සැලකිල්ලට නොගෙන ඉහළ මිල ගණන් යටතේ මිල විශ්ලේෂණ සකස් කර ඇති බවත් නිරීක්ෂණය විය. ඉහත කරුණු අනුව මෙකී ගෙවීම් මඟින් දෙපාර්තමේන්තුවට අවාසි සහ අලාභදායී තත්ත්වයක් ඇති බව නිරීක්ෂණය කෙරේ.

4.5 කළමනාකරණ දුර්වලතා

කුරුඳු කර්මාන්තය නියාමනය කිරීම, ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, ශ්‍රී ලාංකීය කුරුඳු සන්නාමය(Ceylon Cinnamon) ආරක්ෂා කිරීම සහ අපනයන ආදායම වැඩි කිරීම සඳහා කුරුඳු සංවර්ධන පනත සම්මත කිරීම අත්‍යාවශ්‍ය වුවද, ඒ සඳහා සකස් කළ අවසන් සංශෝධිත කෙටුම්පත 2024 දී දෙපාර්තමේන්තුවේ එවකට රේඛීය අමාත්‍යාංශය වූ වැවිලි හා යටිතල පහසුකම් අමාත්‍යාංශයට යොමුකර තිබුණද, එය වර්තමාන රේඛීය අමාත්‍යාංශය වූ කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා මේ දක්වා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කරගෙන නොතිබුණි.

05. යහපාලනය

5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පාංශු හා ශාක පෝෂක අංශය, ශෂ්‍ය විද්‍යා හා භෝග දියුණු කිරීම් අංශය, පසු අස්වනු තාක්ෂණික අංශය සහ ශාක ආරක්ෂණ අංශවල විද්‍යාගාර පහසුකම් ප්‍රමාණවත් නොවීම, ප්‍රමාණවත් විදුලි සැපයුම් නොමැති වීම, තාක්ෂණික නිලධාරීන් හා කම්කරුවන් හිඟය හේතුවෙන් පර්යේෂණ කාර්යයන් ප්‍රමාදවන බව නිරීක්ෂණය විය.

(ආ) පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ පසු අස්වනු තාක්ෂණික අංශයේ පර්යේෂණ කටයුතු සඳහා භාවිතා කරන Rotary Evaporator යන්ත්‍රය 2025 මැයි සිටද, ජල ක්‍රියාකාරීත්වය පිළිබඳ වාර්තා ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක වන Water activity meter 2024 නොවැම්බර් සිටද, පාංශු PH අගය, පාංශු EC, පාංශු හෝ ශාක විශ්ලේෂණ නයිට්‍රජන්, පොස්පරස්, පසෙහි හුවමාරු කළ හැකි පොටැසියම් විශ්ලේෂණ සඳහා වාර්තා ලබා ගැනීමට භාවිතා කරන Water distillation Unit උපකරණ 2025 ජනවාරි සිටද, පසෙහි හුවමාරු කළ හැකි පොටැසියම් විශ්ලේෂණ සඳහා භාවිතා කරන Flame Photometer උපකරණය 2026 මාර්තු සිටද, අක්‍රිය තත්ත්වයේ පැවතීම හේතුවෙන් පර්යේෂණ කටයුතු ප්‍රමාද වීම සහ විශ්ලේෂණ වාර්තා නිවැරදි නොවීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය.

5.2 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 133 හා 134 යන රෙගුලාසිවල දැක්වෙන විධිවිධානයන් සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) ඊ වගන්තිය ප්‍රකාරව මේ දක්වා දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

06. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂයේ කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03 ක් තෘතික මට්ටමේ තනතුරක්, ද්විතියික මට්ටමේ තනතුරු 35 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 09ක් පුරප්පාඩු බවට පත්ව තිබේ. මෙම මානව සම්පත් හිඟය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ක්ෂේත්‍ර සේවාවන් ප්‍රවර්ධනය කෙරෙහි අහිතකර බලපෑම් ඇති කර ඇති අතර කර්මාන්තයේ වර්ධනය ද මන්දගාමී වීමටද මෙය හේතු වී තිබුණි.

එම්.පී. මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය.

එම්.ජී.මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය 04

කාර්ය සාධන දර්ශක

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

4.1.1. පුළුල් පර්යේෂණ හා සංවර්ධන වැඩසටහනක් හරහා ලංකා කුරුඳු ප්‍රවර්ධනය

2025 වර්ෂයේදී "ලංකා කුරුඳු නඟා සිටුවීම - ඵලදායිතාව, ගුණාත්මකභාවය සහ වටිනාකම ඉහළ නැංවීම" වැඩසටහන යටතේ, කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව, නම් කරන ලද ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස දෙපාර්තමේන්තු වැය ශීර්ෂය වන 337, 2202 වැය විෂය යටතේ භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් ලබා දී ඇති ප්‍රතිපාදන වලින් රුපියල් 93,346,424.81 ක් වැය කර සාර්ථක ලෙස වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

නිෂ්පාදන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, නිෂ්පාදනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම, අගය වැඩිකිරීම ශක්තිමත් කිරීම සහ ලංකා කුරුඳු වල ගෝලීය තරඟකාරිත්වය ඉහළ නැංවීම සඳහා මෙම සම්බන්ධීකරණ මැදිහත්වීම් උපායමාර්ගිකව සැලසුම් කර ඇත. සමස්තයක් ලෙස ගත් කල, තිරසාර වර්ධනය පෝෂණය කිරීම, නවීකරණය ප්‍රවර්ධනය කිරීම සහ ඉලක්කගත ආයෝජන සහ සහයෝගීතා හවුල්කාරිත්වයන් තුළින් ජාත්‍යන්තර වෙළඳපොළ තුළ එහි ස්ථානය ශක්තිමත් කිරීම මගින් ශ්‍රී ලංකාවේ කුරුඳු කර්මාන්තයේ ධනාත්මක පරිවර්තනයක් සඳහා දෙපාර්තමේන්තුවේ කැපවීම මෙම වැඩසටහන හරහා අවධාරණය කරයි.

වැඩසටහන	වෙන් කරන ලද ප්‍රතිපාදන (රු. මිලියන)	භෞතික ඉලක්ක	භෞතික ප්‍රගතිය
තිරසාර ලෙස නව වගා වපසරිය පුළුල් කිරීම	76.95	හෙක්ටයාර් ගණන – 570	හෙක්ටයාර් ගණන – 565.56 මුළු පැළ සංඛ්‍යාව – 5,089,997 ප්‍රතිලාභීන් සංඛ්‍යාව – 1,871
කුරුඳු ඵලදායිතා ප්‍රවර්ධනය	17.10	හෙක්ටයාර ගණන - 350 පාංශු pH අගය පරීක්ෂණ පැවැත්වීම - 2,000 කුරුඳු පළිබෝධ ආරක්ෂණ ඒකක – 20 ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති – 8	හෙක්ටයාර ගණන – 332 මුළු පැළ සංඛ්‍යාව – 396,401 පාංශු pH පරීක්ෂණ පැවැත්වීම – 3,242 කුරුඳු පළිබෝධ ආරක්ෂණ ඒකක – 3 ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති – 1 ප්‍රතිලාභීන් සංඛ්‍යාව – 561
තත්ත්ව පාලන සහතිකකරණය	0.55	GMP, ISO 22000, HACCP සහ වෙනත් - 3	GMP, ISO 22000, HACCP සහ වෙනත් - 3
සන්නිවේදනය, වෙළඳපල ප්‍රවර්ධනය සහ ඩිජිටල් පද්ධති සංවර්ධනය	0.1	බෙදා හරින ලද මුද්‍රිත ද්‍රව්‍ය සංඛ්‍යාව - 10,000	අත් පත්‍රිකා ගණන - 10,000 පොත් ප්‍රමාණය – 2,500
පුහුණුව සහ ධාරිතා සංවර්ධනය	4.3	ගොවි පුහුණු වැඩසටහන් – 600 ක්ෂේත්‍ර දින වැඩසටහන් හා වැඩමුළු – 60 වෙනත් ආයතන වල පුද්ගලයින් සඳහා පුහුණුව සඳහා පහසුකම් සැලසීම - 10 TOT වැඩසටහන් ක්‍රියාත්මක කිරීම – 05 ඩිජිටල් ව්‍යාප්ති වැඩසටහන් – 12	ගොවි පුහුණු වැඩසටහන් – 582 ක්ෂේත්‍ර දින වැඩසටහන් හා වැඩමුළු – 100 වෙනත් ආයතන වල පුද්ගලයින් සඳහා පුහුණුව සඳහා පහසුකම් සැලසීම – 07 TOT වැඩසටහන් ක්‍රියාත්මක කිරීම – 03 ඩිජිටල් ව්‍යාප්ති වැඩසටහන් – 09
පරිපාලන වියදම්	1.0		
මුළු වෙන් කිරීම	100.00		

4.1.2. ලංකා කුරුඳු වල තරඟකාරිත්වය සහ ගෝලීය ව්‍යාප්තිය ශක්තිමත් කිරීම

2025 වර්ෂයේ දී "ලංකා කුරුඳු තරඟකාරිත්වය සහ ගෝලීය ව්‍යාප්තිය ශක්තිමත් කිරීම" වැඩසටහන යටතේ, කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව නම් කරන ලද ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය ලෙස දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂය වන 289, 2202 වැය විෂය යටතේ භාණ්ඩාගාරය මගින් ලබා දුන් ප්‍රතිපාදන වලින් රුපියල් 110,621,775.00 ක් වැය කරන ලදී.

නවීකරණය සහ නවෝත්පාදනයන් තුළින් තිරසාර කර්මාන්ත වර්ධනය ප්‍රවර්ධනය කරන අතරම ලංකා කුරුඳුවල ගෝලීය තරඟකාරිත්වය ඉහළ නැංවීම සඳහා මෙම සම්බන්ධීකරණ මැදිහත්වීම් උපායමාර්ගිකව සැලසුම් කරන ලදී. සමස්තයක් ලෙස ගත් කල, ඉලක්කගත ආයෝජන සහ සහයෝගීතා හවුල්කාරිත්වයන් තුළින් තිරසාර වර්ධනයක් අත්කර ගැනීම සහ ගෝලීය වෙළඳපොළ විනිවිද යාම ශක්තිමත් කිරීම මගින් ශ්‍රී ලංකාවේ කුරුඳු කර්මාන්තය පරිවර්තනය කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ අඛණ්ඩ කැපවීම මෙම වැඩසටහන මගින් පිළිබිඹු වේ.

4

වැඩසටහන	වෙන් කරන ලද ප්‍රතිපාදන (රු. මිලියන)	භෞතික ඉලක්ක	භෞතික ප්‍රගතිය
තිරසාර ලෙස නව වගා වපසරිය පුළුල් කිරීම	67.0	හෙක්ටයාර ගණන – 300	හෙක්ටයාර ගණන – 508.16 මුළු පැළ සංඛ්‍යාව – 4,572,658 ප්‍රතිලාභීන් සංඛ්‍යාව – 3,218
කුරුඳු ඵලදායිතා ප්‍රවර්ධනය	35.0	හෙක්ටයාර ගණන – 250	හෙක්ටයාර ගණන – 441.08 මුළු පැළ සංඛ්‍යාව – 588,862 ප්‍රතිලාභීන් සංඛ්‍යාව – 750
පශ්චාත් අස්වනු සැකසීම සහ අගය එකතු කිරීම ප්‍රශස්ත කිරීම	37.5	නව පිරිසැකසුම් පහසුකම් ස්ථාපිත කිරීම – 20 යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිලදී ගැනීම – 20 GAP, GI සහතිකකරණය – 80 GMP, ISO 22000, HACCP සහ වෙනත් – 10	කුරුඳු සැකසුම් මධ්‍යස්ථාන - 34 තෙල් ආසවනය ඒකක – 11 සැකසීම සහ අගය එකතු කිරීමේ යන්ත්‍ර සූත්‍ර – 11 GAP සහතික – 50 GI සහතික – 05
කුරුඳු වෙළඳපොළ ප්‍රවර්ධනය	1.0	තානාපති කාර්යාල සමඟ වැඩසටහන් – 3 වෙළඳපොළ ප්‍රවර්ධන වැඩසටහන් – 3	
පුහුණුව සහ ධාරිතා සංවර්ධනය	5.0	ගොවි පුහුණු පාඨමාලා – 75 ක්ෂේත්‍ර දින වැඩසටහන් හා වැඩමුළු – 40	
පරිපාලන වියදම්	4.5		

මුළු වෙන් කිරීම	150.00		

4.1.1.1. කුරුඳු නව වගාව පුළුල් කිරීම

2025 දී, කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කුරුඳු වගාව යටතේ ජාතික භූමි ප්‍රමාණය පුළුල් කිරීම සහ වර්ධනය වන දේශීය හා ජාත්‍යන්තර ඉල්ලුම සපුරාලීම සඳහා සමස්ත නිෂ්පාදනය ඉහළ නැංවීමේ මූලික අරමුණ ඇතිව නව කුරුඳු වගා වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. සුදුසු කෘෂි පාරිසරික කලාපවල නව කුරුඳු වගාවන් ස්ථාපිත කිරීම සහ එමඟින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදන පදනම ශක්තිමත් කරමින් කලාපීය විවිධාංගීකරණය ප්‍රවර්ධනය කිරීම කෙරෙහි මෙම වැඩසටහන අවධානය යොමු කළේය. ලියාපදිංචි පෞද්ගලික පැළ තවාන් 595 ක සම්බන්ධීකරණ කටයුතු තුළින් උසස් තත්ත්වයේ කුරුඳු පැළ 9,662,655 ක් බෙදා හරින ලද අතර එමඟින් නව කුරුඳු ඉඩම් හෙක්ටයාර 1,073.72 ක් ස්ථාපිත කිරීමට පහසුකම් සපයන ලදී. දකුණ, ඌව, බස්නාහිර, සබරගමුව, මධ්‍යම, උතුරු මැද සහ වයඹ පළාත් වල දිස්ත්‍රික්ක 16 ක් පුරා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර ඒ හරහා පුළුල් භූගෝලීය ආවරණයක් සහතික කරන ලදී.

සහතික කළ රෝපණ ද්‍රව්‍යය භාවිතය, සුදුසු භූමි තෝරා ගැනීම සහ නිර්දේශිත කෘෂි විද්‍යාත්මක භාවිතයන් පිළිපැදීම ප්‍රවර්ධනය කිරීම මගින් තිරසාර නව වගා ව්‍යාප්තිය සඳහා මෙම වැඩසටහන සැලසුම් කර ඇත. ශාක මිය යාමේ අනුපාතය අවම කිරීම සහ මුල් අවධියේ වර්ධන ඉහළ නැංවීම සඳහා වර්ධන අවධිය පුරාම තාක්ෂණික මග පෙන්වීම, ක්ෂේත්‍ර අධීක්ෂණය සහ ව්‍යාප්ති සහාය ලබා දීම සඳහා කුරුඳු සංවර්ධන නිලධාරීන් යොදවන ලදී. කෘෂි අංශයේ වර්ධනය, අපනයන සංවර්ධනය සහ තිරසාර ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ජාතික අරමුණු සමඟ සමපාත වෙමින් නව කුරුඳු වගා වැඩසටහන නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම, ගොවියන්ගේ ආදායම් අවස්ථා වැඩි දියුණු කිරීම සහ ලංකා කුරුඳු දිගුකාලීන ගෝලීය තරඟකාරිත්වය සඳහා සෘජුවම දායක වේ.

4.1.1.2. කුරුඳු ඉඩම්වල ඵලදායිතාව ඉහළ නැංවීම

2025 දී කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කුරුඳු ඉඩම් සඳහා ඵලදායිතාව වැඩි දියුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලද්දේ දැනට පවතින කුරුඳු වගාවල ඵලදායිතාව, තිරසාරභාවය සහ දේශගුණික විපර්යාස සඳහා ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීමේ අරමුණෙනි. වගාවේ පාලු සිටුවීම, පළිබෝධ ආරක්ෂණ පද්ධති ස්ථාපනය සහ ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති ස්ථාපනය වැනි ඉලක්කගත මැදිහත්වීම් හරහා ඉඩමේ ඵලදායිතාව ප්‍රශස්ත කිරීම කෙරෙහි මෙම වැඩසටහන හරහා අවධානය යොමු කළේය. කෑගල්ල, කුරුණෑගල, කළුතර, කොළඹ, ගම්පහ, ගාල්ල, රත්නපුරය, මාතර, මහනුවර, මාතලේ සහ හම්බන්තොට යන කුරුඳු වගා කරන ප්‍රමුඛ දිස්ත්‍රික්කවල හෙක්ටයාර 773 ක් පුනරුත්ථාපනය කිරීමට හැකි වන පරිදි

ලියාපදිංචි පෞද්ගලික තවාන් 595 ක් හරහා උසස් තත්ත්වයේ කුරුඳු පැළ 959,563 ක් බෙදා හරින ලදී. කුරුඳු සංවර්ධන නිලධාරීන් විසින් දෙපාර්තමේන්තුවේ සම්පත් ධාරිතාව තුළ ඵලදායී ලෙස භාවිතා කිරීම සහතික කිරීම සඳහා ක්ෂේත්‍ර මට්ටමේ තාක්ෂණික මග පෙන්වීම සහ අධීක්ෂණය ලබා දෙන ලදී.

කුරුඳු ඉඩම් පුනරුත්ථාපනයට අනුපූරක වෙමින්, මෙම වැඩසටහන ක්ෂීරපායී පළිබෝධකයින්ගෙන් සිදුවන පාඩු අවම කිරීම සඳහා ආරක්ෂිත වැටවල් ඇතුලු සත්ත්ව ආරක්ෂණ පද්ධති හඳුන්වා දුන් අතර දේශගුණික විපර්යාස වලට අනුහුරු වීම තුළින් තෙතමන කළමනාකරණය වැඩි දියුණු කිරීම සඳහා ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධතිය හඳුන්වා දෙන ලදී. මෙම ඒකාබද්ධ මැදිහත්වීම් මගින් බෝගයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම, අස්වැන්න අහිමිවීම අඩු කිරීම සහ සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවලට වගාව ව්‍යාප්ත කර සමස්ත ඵලදායිතාව වැඩි දියුණු කිරීම අරමුණු විය. සාමූහිකව මෙම වැඩසටහන මගින් වගාකරුවන්ගේ ජීවනෝපායට සහාය වීය සඳහා තිරසාර උපායමාර්ගික ප්‍රවේශයක් පිළිබිඹු කරන අතරම, ලංකා කුරුඳු වල ගුණාත්මකභාවය, ඵලදායිතාව සහ ගෝලීය තරඟකාරිත්වය ඉහළ නැංවීම බලපොරොත්තු වේ.

4

4.1.1.3. නව සැකසුම් පහසුකම් ස්ථාපිත කිරීම, අගය එකතු කිරීම සහ සැකසුම් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ තත්ත්ව පාලන සහතිකකරණය

2025 දී, පශ්චාත් අස්වනු තාක්ෂණය සහ අගය එකතු කිරීමේ සංවර්ධන වැඩසටහන යටතේ, කුරුඳු සැකසීම නවීකරණය කිරීම, යාන්ත්‍රීකරණය ප්‍රවර්ධනය කිරීම සහ අගය දාමය පුරා තත්ත්ව සහතික කිරීමේ පද්ධති ශක්තිමත් කිරීම සඳහා කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව මැදිහත් විය. පෙර මුලපිරීම් මත පදනම්ව, මෙම වැඩසටහන කුඩා පරිමාණ, ගෘහස්ථ සැකසුම් මධ්‍යස්ථාන සිට ජාත්‍යන්තර තත්ත්ව ප්‍රමිතීන්ට අනුකූල විය හැකි වෙළඳපළ නැඹුරු සැකසුම් පද්ධති වෙත මාරුවීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. 2025 වසර තුළ, කුරුඳු සැකසුම් මධ්‍යස්ථාන 34 ක් සහ කුරුඳු තෙල් ආසවනය කිරීමේ ඒකක 11 ක් ස්ථාපනය සඳහා සහාය වූ අතර, සැකසුම් සහ අගය එකතු කිරීමේ යන්ත්‍ර සූත්‍ර සඳහා ආයෝජන 11 ක් සමඟ සැකසුම් කාර්යක්ෂමතාව, අනුකූලතාව සහ නිෂ්පාදන ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට පහසුකම් සපයන ලදී. මෙම මැදිහත්වීම් පශ්චාත් අස්වනු හානි අවම කිරීමට, ශ්‍රම ඵලදායිතාව වැඩි දියුණු කිරීමට සහ අපනයන-වෙළඳපොළ අවශ්‍යතා සමඟ අනුකූල වීම වැඩි දියුණු කිරීමට දායක විය.

වෙළඳපළ ප්‍රවේශය සහ වටිනාකම් සාක්ෂාත් කර ගැනීම සඳහා තීරණාත්මක සක්‍රීය ඒකකයන් ලෙස තත්ත්ව සහතික කිරීම හඳුනා ගනිමින්, මෙම වැඩසටහන ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් කෙරෙහි දැඩි අවධානයක් යොමු කළේය. ඒ අනුව, යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) යටතේ නිෂ්පාදකයින් 50 දෙනෙකුට සහාය ලබා දුන් අතර, ලංකා කුරුඳු වෙළඳ නාමය ශක්තිමත් කිරීම සඳහා භූගෝලීය දර්ශක සහතික (GI) මුලපිරීම් 05 ක් සඳහා පහසුකම් සැලසීම සිදු කරන ලදී. මීට අමතරව, පාරිභෝගික විශ්වාසය සහ අපනයන වෙළඳපොළ තවදුරටත් ශක්තිමත් කරමින් GMP, ISO 22000, HACCP සහ ඒ ආශ්‍රිත ප්‍රමිතීන් ඇතුළුව උසස් ආහාර සුරක්ෂිතතාව සහ තත්ත්ව සහතික ලබා ගැනීම සඳහා සැකසුම් ආයතන 03 කට සහාය විය. සාමූහිකව, මෙම ඒකාබද්ධ මැදිහත්වීම් හරහා අංශයේ සාම්ප්‍රදායික වශයෙන් ඇති අවම අගය එකතු කිරීමේ කොටස ආමන්ත්‍රණය කරමින් කුරුඳු කර්මාන්තයේ ගුණාත්මක බව ඉහළ නංවමින්, ගෝලීය තරඟකාරී සහ තිරසාර අපනයන අංශයක් ලෙස ස්ථානගත කිරීම සඳහා ශක්තිමත් පදනමක් දමනු ලැබේ.

ඒකකයේ වර්ගය	භෞතික ඉලක්ක	භෞතික ප්‍රගතිය
නව කැබිනට් වියළන යන්ත්‍ර	1	1
නව Flat-Bed වියළන යන්ත්‍ර	1	1
වර්ණ අනුව වෙන්කිරීමේ යන්ත්‍ර (Color sorter)	1	1
ඉමල්සිෆයර් යන්ත්‍ර	1	1
කුරුඳු කැබලි කරන යන්ත්‍ර	3	3
කුරුඳු ඇඹරුම් යන්ත්‍ර	1	1
ජල-සිසිල් කුරුඳු ඇඹරුම් යන්ත්‍ර	2	2
පොලිතීන් මුද්‍රා තැබීමේ යන්ත්‍ර	1	1
කුරුඳු කොළ තෙල් (ධාරිතාව කිලෝග්‍රෑම් 250 ට වැඩි) ඒකක	9	9
කුරුඳු පොතු තෙල් ඒකක	2	2
කේන්ද්‍රීය සැකසුම් මධ්‍යස්ථාන	4	4
සැකසුම් ඒකකය (සැකසුම් වපසරිය: වර්ග අඩි 400-499)	17	17
සැකසුම් ඒකකය (සැකසුම් වපසරිය: වර්ග අඩි 500-599)	3	3
සැකසුම් ඒකකය (සැකසුම් වපසරිය: වර්ග අඩි 600-799)	5	5
සැකසුම් ඒකකය (සැකසුම් වපසරිය: වර්ග අඩි 800-1000)	5	5

4.1.1.4. ධාරිතා සංවර්ධන සහ පුහුණු වැඩසටහන්

2025 දී, කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව ලංකා කුරුඳු කර්මාන්තය තුළ ඵලදායිතාව, තත්ත්ව ප්‍රමිතීන් සහ තිරසාරභාවය ඉහළ නැංවීම සඳහා මූලික උපාය මාර්ගයක් ලෙස ධාරිතා සංවර්ධනය සහ දැනුම බෙදා හැරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. පෙර මුලපිරීම් මත පදනම්ව, ගොවීන්, සැකසුම්කරුවන්, ක්ෂේත්‍ර නිලධාරීන් සහ අගය දාමයේ සිටින අනෙකුත් ප්‍රධාන පාර්ශවකරුවන් සියල්ල ආමන්ත්‍රණය වන පරිදි අවශ්‍යතා සපුරාලීම සඳහා දෙපාර්තමේන්තුව සිය පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්වල පරිමාණය, ප්‍රවේශය සහ විවිධත්වය පුළුල් කළේය. ක්ෂේත්‍රය පදනම් කරගත් පුහුණුව, ආයතනික ධාරිතා සංවර්ධනය සහ ඩිජිටල් ව්‍යාප්ති ප්‍රවේශයන්හි එකතුවක් තුළින් නවීන වගා ක්‍රම, ඵලදායී පළිබෝධ හා රෝග කළමනාකරණය, පශ්චාත් අස්වැන්න හැසිරවීම, අගය එකතු කිරීම සහ වෙළඳපළ ඉලක්ක කරගත් නිෂ්පාදන පද්ධති ප්‍රවර්ධනය කිරීම දෙපාර්තමේන්තුවේ අරමුණ විය.

දිස්ත්‍රික් මට්ටමේ ධාරිතා සංවර්ධන වැඩසටහන්

2025 වර්ෂය තුළ, දිස්ත්‍රික් සහ ජාතික මට්ටමින් පුළුල් පරාසයක පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර, සැළකිය යුතු ප්‍රවේශයක් සහ බලපෑමක් අත්කර ගන්නා ලදී:

- ගොවි පුහුණු පාඨමාලා (වැඩසටහන් 582):

  මෙම වැඩසටහන් තවාන් කළමනාකරණය, යහපත් කෘෂිකාර්මික ක්‍රම, පාංශු හා පෝෂක කළමනාකරණය, පළිබෝධ හා රෝග පාලනය, අස්වනු නෙළීමේ ශිල්පීය ක්‍රම සහ පශ්චාත් අස්වැන්න හැසිරවීම ඇතුළු කුරුඳු වගාවේ ප්‍රධාන තාක්ෂණික හා ප්‍රායෝගික අංශ ආවරණය කළේය. මෙම පුහුණු වැඩසටහන්වලින් ගොවීන් 15,625 දෙනෙකු ප්‍රතිලාභ ලබා ගත් අතර ගොවිපළ ඵලදායිතාව වැඩි දියුණු කිරීමට දායක විය.

- ක්ෂේත්‍ර දින සහ වැඩමුළු (වැඩසටහන් 100):

  කුරුඳු වගා කරන ප්‍රදේශවල ප්‍රායෝගික ලෙස ගොවීන් සහ පාර්ශවකරුවන් අතර දැනුම හුවමාරු කර ගැනීම සඳහා ක්ෂේත්‍ර දින සහ වැඩමුළු පවත්වන ලදී. මේ තුළින් යහපත් භාවිතයන්, නව ශිල්පීය ක්‍රම සහ සාර්ථක ක්ෂේත්‍ර අත්දැකීම් හුවමාරු කරගැනීම කෙරෙහි අවධානය යොමු කළ අතර පාර්ශ්වකරුවන් 2,125 කට ප්‍රතිලාභ ලබා දෙන ලදී.

- අනෙකුත් ආයතනික පාර්ශවකරුවන් සඳහා පුහුණු වැඩසටහන් (7 වැඩසටහන්):

  කුරුඳු ක්ෂේත්‍රයට සම්බන්ධ අනෙකුත් අදාළ ආයතනවල නිලධාරීන් සහ පුද්ගලයින් සඳහා විශේෂ පුහුණු වැඩසටහන් පවත්වන ලද අතර, අන්තර් ආයතන සහයෝගීතාව ශක්තිමත් කිරීම සඳහා පාර්ශවකරුවන් 128 දෙනෙකු සඳහා විවිධ අංශවල තාක්ෂණික හා විශේෂ දැනුම ලබා දෙන ලදී.

- දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ (TOT) වැඩසටහන් (3 වැඩසටහන්):

  අභ්‍යන්තර තාක්ෂණික ධාරිතාව ඉහළ නැංවීම සඳහා දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සඳහා ToT වැඩසටහන් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන් ව්‍යාප්ති කුසලතා, තාක්ෂණික දැනුම සහ ඵලදායී ගොවි සහභාගීත්වය වැඩි දියුණු කිරීම අරමුණු කර ගත් අතර ක්ෂේත්‍ර නිලධාරීන් වෙත ප්‍රතිලාභ ලබා දෙයි.

- ඩිජිටල් ව්‍යාප්ති වැඩසටහන් (9 වැඩසටහන්):

  ඩිජිටල් වේදිකාවල වර්ධනය වන වැදගත්කම හඳුනාගනිමින්, දෙපාර්තමේන්තුව විසින් තාක්ෂණික තොරතුරු කාර්යක්ෂමව බෙදා හැරීම සහ පුළුල් පරාසයක් වෙත පහසුවෙන් ළඟා වීම සඳහා ඩිජිටල් ව්‍යාප්ති සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මේ හරහා පාර්ශ්වකරුවන් 285 දෙනෙකුට ප්‍රතිලාභ ලබා දුන් අතර, දැනුම සහ උපදේශන සේවාවන් සඳහා කාලෝචිත ප්‍රවේශයට සහාය විය.

4

විශේෂ දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතය (%) ලෙස සත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
තිරසාර ලෙස නව වගා වපසරිය පුළුල් කිරීම	100		
කුරුඳු ඵලදායිතා ප්‍රවර්ධනය	97.5		
පශ්චාත් අස්වනු සැකසීම සහ අගය එකතු කිරීම ප්‍රශස්ත කිරීම	100		
තත්ත්ව පාලන සහතිකය	100		
සන්නිවේදනය, වෙළඳපළ ප්‍රවර්ධනය සහ ඩිජිටල් පද්ධති සංවර්ධනය	100		
පුහුණුව සහ ධාරිතා සංවර්ධනය	90		

පරිච්ඡේදය 05

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ස්වර්ණමය උරුමයක් බඳු වූ කුරුඳු කර්මාන්තය නවීන ලෝකයේ තිරසාර සංවර්ධන ඉලක්ක කරා මෙහෙයවීම කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූලික මෙහෙවර විය. 2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සියලුම ව්‍යාපෘති, එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයට අනුකූල වන පරිදි සැලසුම් කර තිබූ අතර, එමගින් ග්‍රාමීය දිළිඳුකම පිටුදැකීම, පරිසර හිතකාමී කෘෂිකාර්මික පිළිවෙත් සහ ජාත්‍යන්තර ප්‍රමිතිකරණය යන අංශයන්හි සුවිශේෂී ප්‍රගතියක් අත්කර ගැනීමට හැකි විය.

5.2 හඳුනාගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු සහ ළඟා කරගත් ප්‍රගතිය

2025 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කළ ප්‍රධාන වැඩසටහන් පහත පරිදි තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක විය:

තිරසාර සංවර්ධන ඉලක්කය / අරමුණ	උපායමාර්ගික ප්‍රවේශය	**2025** ජනවාරි - දෙසැම්බර් ජයග්‍රහණ	ප්‍රගතිය (75%-100%)
SDG 1: දරිද්‍රතාවය නිම කිරීම	නව වගා ව්‍යාප්තිය මගින් ග්‍රාමීය ආදායම් මාර්ග සහ වත්කම් ගොඩනැගීම.	දිස්ත්‍රික්ක 16 ක් පුරා **හෙක්ටයාර 1,073.72** ක නව වගාවන් ස්ථාපනය කරමින් පැළ **9,662,655 ක්** බෙදා දෙන ලදී. රුපියල් **මිලියන 145** ක සෘජු මූල්‍ය දායකත්වයක් ගොවීන් වෙත ලබා දෙන ලදී.	✓
SDG 2: කුසගින්න අවසන් කිරීම හා තිරසාර කෘෂිකර්මය	නිෂ්පාදන ධාරිතාවය සහ ඵලදායීතාවය වැඩි කිරීම මගින් ආහාර සුරක්ෂිතතාවයට දායක වීම.	හෙක්ටයාර **772.99** ක වගාබිම් ප්‍රමාණයක ඵලදායීතාවය නැංවීම සඳහා රුපියල් **මිලියන 49.36** ක ආයෝජනයකින් පැළ 959,563 ක් ප්‍රතිස්ථාපනය කරන ලදී.	✓

තිරසාර සංවර්ධන ඉලක්කය / අරමුණ	උපායමාර්ගික ප්‍රවේශය	2025 ජනවාරි - දෙසැම්බර් ජයග්‍රහණ	ප්‍රගතිය (75%-100%)
SDG 8: සුනිසි මෙහෙවර සහ ආර්ථික වර්ධනය	කුසලතා සංවර්ධනය, නවීන යන්ත්‍රෝපකරණ හඳුන්වා දීම සහ වෘත්තීය මට්ටම ඉහළ නැංවීම.	ගොවි පුහුණු වැඩසටහන් **338 ක්** සහ ක්ෂේත්‍ර දින 100 ක් පවත්වා දැනුම ව්‍යාප්ත කරන ලදී. මධ්‍යම සැකසුම් මධ්‍යස්ථාන 4 ක් ඇතුළුව පශ්චාත් අස්වනු ඒකක 55 ක් ස්ථාපිත කරමින් නව රැකියා අවස්ථා නිර්මාණය විය.	✓
SDG 13: දේශගුණික ක්‍රියාකාරකම්	සම්පත් කළමනාකරණය සහ දේශගුණික අවදානම් අවම කිරීම සඳහා තාක්ෂණික සහාය.	පාංශු පරීක්ෂණ සේවා **1,545 ක්** ලබා දෙමින් රසායනික පොහොර අවම කර පස ආරක්ෂා කිරීමට කටයුතු කරන ලදී. ක්ෂුද්‍ර ජල සම්පාදන සහ පළිබෝධ පාලන පද්ධති ස්ථාපනය කෙරිණි.	✓
SDG 15: ගොඩබිම මත ජීවය	පරිසර පද්ධති සංරක්ෂණය සහ ජාත්‍යන්තර ප්‍රමිතිකරණය සහතික කිරීම.	**GAP සහතික 56 ක්** නිකුත් කිරීම සහ **GI බාහිර විගණන 15 ක්** මගින් තිරසාර ඉඩම් කළමනාකරණය තහවුරු විය. මීට අමතරව තෙල් නිස්සාරණ ඒකක 11 ක් හරහා පරිසර හිතකාමී අගය එකතු කිරීමේ ක්‍රියාවලීන් දිරිමත් කරන ලදී.	✓

5.3 2025 වර්ෂයේ ප්‍රධාන මෙහෙයුම් ජයග්‍රහණ සහ කාර්ය සාධන සමාලෝචනය

2025 වසරේදී කුරුඳු සංවර්ධන වැඩසටහන සඳහා රුපියල් මිලියන 250 ක මුළු ප්‍රතිපාදනයක් වෙන් වූ අතර, එහි සාර්ථකත්වය පහත ක්ෂේත්‍ර ඔස්සේ විදහා දැක්වේ:

I. වගා ව්‍යාප්තිය සහ ඵලදායීතාවය (SDG 1 & 2)

වසර පුරා සිදු කළ මෙහෙයුම් වල ප්‍රතිඵලයක් ලෙස දිවයින පුරා කුරුඳු වගා බිම් ප්‍රමාණය සැළකිය යුතු ලෙස වර්ධනය වී ඇත.

- **නව වගා ප්‍රගතිය:** රත්නපුර (හෙක්. 262.24), ගාල්ල (හෙක්. 176.2), මාතර (හෙක්. 154.7) සහ හම්බන්තොට (හෙක්. 139.39) යන දිස්ත්‍රික්කවල ඉහළම සාර්ථකත්වයක් අත්කර ගෙන ඇත.
- **ඵලදායීතා සංවර්ධනය:** පැරණි වගා බිම් පුනර්ජීවනය සඳහා රුපියල් මිලියන 49.36 ක් වැය කර ඇති අතර, ගාල්ල (හෙක්. 270.62) සහ රත්නපුර (හෙක්. 179.83) යන දිස්ත්‍රික්ක මෙහිදී සුවිශේෂී ප්‍රගතියක් පෙන්වා ඇත.

II. පශ්චාත් අස්වනු තාක්ෂණික විප්ලවය (SDG 8 & 13)

කුරුඳු කර්මාන්තයේ පවතින සාම්ප්‍රදායික මුහුණුවර වෙනස් කරමින් රුපියල් **මිලියන 29.38 ක** ආයෝජනයකින් තාක්ෂණික මෙවලම් රාශියක් ගොවීන් සහ ව්‍යවසායකයන් අතර බෙදා දෙන ලදී.

- කැබිනට් හා ෆ්ලැට්-බෙඩ් වර්ගයේ වියළන යන්ත්‍ර, වර්ණ වෙන්කිරීමේ යන්ත්‍ර (Color sorting) සහ කුරුඳු කපන යන්ත්‍ර (Cutter machines) හඳුන්වා දීම.
- කුරුඳු පත්‍ර සහ පොතු තෙල් නිස්සාරණ ඒකක **11 ක්** ස්ථාපිත කරමින් අපද්‍රව්‍ය කළමනාකරණය සහ උපරිම අගය එකතු කිරීම තහවුරු කරන ලදී.

III. ධාරිතා වර්ධනය සහ සහතිකකරණය (SDG 8 & 15)

දැනුම පාදක කරගත් ආර්ථිකයක් නිර්මාණය කිරීම උදෙසා ගොවීන් සහ පාර්ශවකරුවන් සෘජුවම සම්බන්ධ කර ගන්නා ලදී.

- **ගොවි පුහුණුව:** වසර පුරා පුහුණු වැඩසටහන් 338 ක් සහ ක්ෂේත්‍ර දින 100 ක් සාර්ථකව අවසන් කරන ලදී.
- **ප්‍රමිතිකරණ සහනාධාර:** Malwatta Valley සහ Cinatopiya වැනි සමාගම් දිරිමත් කරමින් ජාත්‍යන්තර ප්‍රමිතීන් කරා යොමු කිරීමට අවශ්‍ය මූල්‍ය සහ සහතිකකරණ සහාය ලබා දෙන ලදී.

5.4 පවතින අභියෝග සහ අනාගත උපායමාර්ග

2025 වර්ෂයේ සාර්ථකත්වය මධ්‍යයේ වුවද, ඉදිරි වර්ෂයන් සඳහා අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයක් හඳුනාගෙන ඇත:

- **දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව:** කාලගුණික අස්ථාවරත්වය පාලනය කිරීම සඳහා තවදුරටත් ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාවය.
- **ශ්‍රම හිඟය:** කුරුඳු තැලීම වැනි අංශ සඳහා ඇති ශ්‍රම හිඟයට පිළියමක් ලෙස යාන්ත්‍රිකරණය තවදුරටත් ග්‍රාමීය මට්ටමට ගෙනයාම.
- **අලෙවිකරණ සබඳතා:** GAP සහ GI සහතික ලත් නිෂ්පාදන සඳහා සෘජු ජාත්‍යන්තර වෙළඳපළ සබඳතා ඇති කිරීමේ ඇති වැදගත්කම.

පරිච්ඡේදය 06

මානව සම්පත් පැතිකඩ

කාණ්ඩය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/(අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	14	11	03
තෘතීයික	02	01	01
ද්විතීයික	109	70	39
ප්‍රාථමික	39	31	08
එකතුව	**164**	**113**	**51**

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

තනතුර	සේවය	ශ්‍රේණිය	වැටුප් කේතය	අනුමත කාර්ය මණ්ඩලය	තත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්ප සංඛ්‍ය
අධ්‍යක්ෂ ජනරාල්	ශ්‍රී ල.වි.සේ.	විශේෂ	SL-3	1	1	0
අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන)	ශ්‍රී ල.වි.සේ.	I	SL-1	1	0	1
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රී ල.ප.සේ.	III/II	SL-1	1	1	0
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)	ශ්‍රී ල.වි.සේ.	III/II	SL-1	6	6	0
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන)	ශ්‍රී ල.වි.සේ.	III/II	SL-1	2	2	0

සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්)	ශ්‍රී ල.ක්‍ර.සේ.	III/II	SL-1	1	0	1
ගණකාධිකාරී	ශ්‍රී ල.ග.සේ.	III/II	SL-1	1	1	0
අභ්‍යන්තර විගණක	ශ්‍රී ල.ග.සේ.	III/II	SL-1	1	0	1
පරිපාලන නිලධාරී	ක.සේ.නි.සේ.	අධි	MN 7	1	0	1
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී	ශ්‍රී ල.තො. හා ස.තා.සේ.	2 පංතිය III/II	MN 6	1	1	0
කුරුඳු සංවර්ධන නිලධාරී	දෙපාර්තමේන්තුගත	III/II/I	MN 4	24	0	24
සංවර්ධන නිලධාරී	ස.නි.සේ.	III/II/I	MN 4	71	59	12
ගොවිපළ කළමනාකරු	ශ්‍රී ල.තා.සේ.	III/II/I	MN 3	1	1	0
තාක්ෂණික නිලධාරී	ශ්‍රී ල.තා.සේ.	III/II/I	MN 3	2	0	2
කළමනාකරණ සේවා නිලධාරී	ක.සේ.නි.සේ.	III/II/I/වි	MN 2	10	9	1
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	ශ්‍රී ල.තො. හා ස.තා.සේ.	3 පංතිය III/II/I	MT 1	1	1	0
රියදුරු	ඒ.රි.සේ.	III/II/I/වි	PL 3	6	6	0
කාර්යාල කාර්ය සහායක	කා.සේ.සේ.	III/II/I/වි	PL 1	4	3	1
සංචාරක බංගලා භාරකරු	දෙපාර්තමේන්තුගත	III/II/I	PL 1	1	1	0
ක්ෂේත්‍ර කම්කරු	දෙපාර්තමේන්තුගත	III/II/I	PL 1	25	18	7
මුරකරු	දෙපාර්තමේන්තුගත	III/II/I	PL 1	3	3	0
			එකතුව	164	113	51

6.2. ආයතනයේ ක්‍රියාකාරීත්වයට මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය

දැනට දෙපාර්තමේන්තුවේ සඳහා අනුමත සමස්ත කාර්ය මණ්ඩලය 164 ක් වන අතර, 2025.12.31 දිනට මෙම දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු සංඛ්‍යාව 51කි. මේ අතුරින් ද්විතීයික හා ප්‍රාථමික ශ්‍රේණිවලට අයත් නිලධාරීන් 34 ක් බඳවා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා වන ඉල්ලීම අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුතු රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණ කමිටුව වෙත යොමු කර ඇත. මෙතෙක් ඊට අනුමැතිය ලැබී නොමැත.

එසේම ද්විතීයික ශ්‍රේණියට අයත් නිලධාරීන්ගේ ඌණතාවය දැඩි ලෙස බලපා ඇති අතර, ක්ෂේත්‍රයේ ව්‍යාප්ති හා සංවර්ධන කටයුතු සඳහා සෘජුවම පහසුකම් සම්පාදනය කරනු ලබන කුරුඳු සංවර්ධන නිලධාරීන් බඳවා ගැනීමට අදාළව කුරුඳු සංවර්ධන නිලධාරී බඳවා ගැනීමේ පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කර ඇති අතර, කුරුඳු සංවර්ධන නිලධාරීන්ගේ පුරප්පාඩු තනතුරු 24 බඳවා ගැනීම සඳහා වූ විවෘත තරඟ විභාගය 2026 වර්ෂය නිමවීමට පෙර පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇත.

එසේම, ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) තනතුර සඳහා මෙන්ම අභ්‍යන්තර විගණක තනතුර සඳහා සුදුසු නිලධාරීන් වැඩ බැලීමේ පදනමින් අනුයුක්ත කර ගැනීමට අදාළ වන ඉල්ලීම් ද පත්වීම් බලධාරීන් වෙත යොමු කර ඇත.

ඒ අනුව ජාතික විගණන පනතේ විධිවිධාන හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කොට පවත්වා ගෙන යාම ඉදිරියේ දී ආරම්භ කිරීමට හැකියාව පවතින අතර, ඒ තුළින් යහපාලන මූලධර්ම පිළිපැදීම, අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම හා අවදානම් කළමනාකරණයට අදාළව ගත යුතු පියවර ගැනීම හැකියාව ඇතිවේ.

තව ද ක්ෂේත්‍රයේ ප්‍රමාණවත් නිලධාරීන් නොමැති වීමට කෙටි කාලීන විකල්ප පියවරක් ලෙස, දැනටමත් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරනු ලබන සංවර්ධන නිලධාරීන් අතුරින් සුදුසු එක් නිලධාරියෙකු බැඟින් හඳුනාගෙන එම නිලධාරීන් පුහුණු කරවා, එකී නිලධාරීන් මාර්ගයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සේවා සැපයීමට ද සැලසුම් කර ඇත. ඒ තුළින් ක්ෂේත්‍රයේ පවතින මානව සම්පත් ඌනතාවයට යම්තාක් දුරට විසඳුම් ලබා දීමට හැකිවනු ඇත.

කෙසේ වෙතත් ඉදිරි උපාය මාර්ගික ඉලක්ක සාධනය සඳහා අනුමත කාර්ය මණ්ඩලය තවදුරටත් සමාලෝචනය කිරීමේ අවශ්‍යතාවය ද පැන නැඟී ඇති අතර, ඒ යටතේ දිපව්‍යාප්ත සේවා හා ඒකාබද්ධ සේවා තනතුරු 09ක් අලුතින් ඇති කිරීම ද සඳහා වන ඉල්ලීම් ද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

6.3. මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණුව ලත් කාර්ය මණ්ඩලය	වැඩසටහන් කාල සීමාව	මුළු ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය	
				දේශීය (රු)	විදේශීය (රු)	දේශීය (රු	විදේශීය (රු)
01.	රාජ්‍ය පරිපාලනය හා කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව - පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය	කේ.ඩී.සී. ගුණසේකර මයා - නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)		250,000		දේශීය	
02.	නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2024 පුහුණු වැඩසටහන - ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය	කේ.ඩී.සී. ගුණසේකර මයා - නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) ආර්.ඒ.ඒ.කේ. රණවක මයා - නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)	2025.02.26-2025.02.27	20,000		දේශීය	
03.	රාජ්‍ය අංශයේ තොරතුරු තාක්ෂණ ආශ්‍රිත නිෂ්පාදන සහ සේවා ප්‍රසම්පාදනය - ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය	ආර්.ඒ.ඒ.කේ. රණවක මයා - නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) කේ.එච්.ජී.ඩී. චාන්දනී මිය - තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ නිලධාරී	2025.09.10 - 2025.09.11	12,000		දේශීය	
04.	කාබන් වැය වීම අවම තත්ත්ව යටතේ වැවිලි ආර්ථිකයක් සඳහා කාබන් භාවිතය අවම කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන -	කේ.එච්.ජී.එම්. තරංගා මිය	2025.11.12	8,000		දේශීය	

	ජාතික වැවිලි කළමනාකරණ ආයතනය						
05.	ආකල්ප සංවර්ධන පුහුණු වැඩසටහන	ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ සියලුම නිලධාරීන්	2025.12.19	46,207.95		දේශීය	
06.	ආරක්ෂිත වෙළඳාම සඳහා පළිබෝධ රෝග විනිශ්චය, පළිබෝධ අවදානම් විශ්ලේෂණය, පළිබෝධ නිරීක්ෂණ සහ ශාක සනීපාරක්ෂක ප්‍රතිකාර පිළිබඳ පාඨමාලාව - ඉන්දියාව	ඒ.යූ. විදානපතිරණ මයා - නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)	2025.09.03 - 2025.09.16		114,562.50		විදේශීය
07.	කාර්යක්ෂම අලෙවිකරණය තුළින් කුඩා වතුහිමියන් සඳහා කෘෂිකර්මාන්තය පරිවර්තනය කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන - ඉන්දියාව	ඊ.ජේ.එස්.ද සොයිසා මයා - නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන)	2025.09.10 - 2025.09.23		116,243		විදේශීය
08.	කෘෂිකර්මාන්තයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන - ඉන්දියාව	එච්.කේ.කේ.ඩී. පතිරණ මයා - නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන)	2025.11.12 - 2025.11.25		117,346.88		විදේශීය
09.	ප්‍රතිපත්ති, පාලනය සහ තාක්ෂණ මැදිහත්වීම් තුළින් සමුපකාර සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල දායකත්වය සහ තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම පිළිබඳ වට මේස සාකච්ඡාව - ඉන්දියාව	කේ.ඩී.සී. ගුණසේකර මයා - නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)	2025.12.02 - 2025.12.06		79,464.61		විදේශීය
10.	මූල්‍යකරණය ඇතුළත් කෘෂිකර්මාන්තය සහ ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන - ඉන්දියාව	පී.ඒ.ඩී.ප්‍රතිභා මිය - සංවර්ධන නිලධාරී	2025.12.01 - 2025.12.12		109,025		විදේශීය

2025 වර්ෂයට අදාළ මානව සම්පත් සංවර්ධන සැලැස්මට අනුකූලව කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හා ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ, තෘතියික, ද්විතීයික හා ප්‍රාථමික සේවා මට්ටම්වල නිලධාරීන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා සංවර්ධනය

කර ගැනීම සඳහා වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවන් සැලසෙන බව තහවුරු වන පරිදි, වක්වැල්ලේ පිහිටි දකුණු පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය වෙත පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කරන ලදි. පහත පුහුණු වැඩසටහන් සඳහා දෙපාර්තමේන්තුව විසින් පිරිවැය දැරීමකින් තොරව නිලධාරීන් යොමු කිරීමට හැකිවීම සුවිශේෂී කරුණක් ලෙස දැක්විය හැකිය.

අනු අංකය	පුහුණු වැඩසටහන	ඉලක්ක කණ්ඩායම	දින ගණන	සහභාගී වූ නිලධාරීන් ගණන
01	"AI for transforming public service" workshop	විධායක මට්ටමේ නිලධාරීන්	½	04
02	Pay roll	සංවර්ධන නිලධාරී කළමනාකරණ සේවා නිලධාරී	05	02
03	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම		01	03
04	GOOGLE OPTIONS/ PIVOT TABLE & GOOGLE SHEET		01	13
05	ප්‍රසම්පාදන ක්‍රියාවලිය		03	03
06	Advanced Access		03	01
07	වාහන අනතුරු හා අලාභ හානි වාර්තා කිරීම හා මු.රෙ 104(3) හා 104(4) පරීක්ෂණ මණ්ඩලවල කාර්යභාරය		02	03
08	වාහන නඩත්තුව, දෛනික ධාවන සටහන් පරීක්ෂා කිරීම හා වාහන අපහරණය කිරීම		01	04
09	පෞද්ගලික ලිපිගොනුකරණය		02	04
10	හදිසි අනතුරු නිවාඩු හා වන්දි අනුමත කිරීම		01	03
11	ගබඩාකරණය හා භාණ්ඩ සමීක්ෂණය		02	04
12	Internet & Email		02	06
13	පරිගණක ආශ්‍රිතව (cloud space) හා ලිපිගොනු සංරක්ෂණය		02	03
14	Graphic Design		03	02
15	Advance Excel		03	01
16	ලිපිගොනුකරණය, රාජකාරි ලිපි ලිවීම, කාර්යාල සටහන් ලිවීම හා කාර්යාල කළමනාකරණය		03	03
17	Microsoft Powerpoint (Advance)		03	01
18	ව්‍යාපෘති කළමනාකරණය		03	02
19	New Cigas		05	02
20	ස්ථාවර වත්කම් කළමනාකරණය		01	02
21	Computer Hardware		02	01
22	Basic Computer		03	04
23	Advance Word		03	02
24	ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති		02	02
25	ආයතනයේ එදිනෙදා ජීවිතයේ ගැටළු විසඳා ගැනීම, ප්‍රායෝගික ක්‍රම ඇතුළත් මනෝවිද්‍යාත්මක උපදේශනය		01	03

26	විගණන පනත හා විගණන විමසුම් අවම කිරීම	විෂය නිලධාරීන්	01	01
27	අභ්‍යන්තර විගණණයේ නව ප්‍රවණතා		01	02
28	විශ්‍රාම වැටුප්		02	01
29	වැටුප් පරිවර්තනය		02	02
30	විශ්‍රාම වැටුප් පිළිබඳ ගැටළු		01	01
31	ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලිය - 2025/2026		01	02
32	ISO තත්ත්ව කළමනාකරණය පිළිබඳ විගණන සිදු කිරීම		01	01
33	භාණ්ඩ, වැඩ හා උපදේශනාත්මක නොවන සේවා සඳහා 2025 නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කිරීම		01	01
34	පුස්තකාල වර්ගීකරණය හා සූචිකරණය		02	01
35	නිවාඩු භාර නිලධාරියාගේ කාර්යයභාරය හා වගකීම		01	02
36	කාර්යාල විදුලි උපකරණ නඩත්තුව	ප්‍රාථමික සේවා මට්ටමේ නිලධාරීන්	01	01

ඒ අනුව, 2025 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ සියලුම මට්ටම්වල නිලධාරීන් ආවරණය වන පරිදි දේශීය හා විදේශීය පුහුණු අවස්ථා සලසා දීමට හැකියාව ලැබුණි. කෙසේ වුවද ජාතික අයවැය චක්‍රලේඛ මඟින් පනවා ඇති වියදම් සීමා හේතුවෙන් හැකියා වර්ධන වැය විෂය සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන පූර්ණ වශයෙන් උපයෝජනය කිරීමට පැවති අවස්ථාව සීමා විය.

එසේම අයවැය ප්‍රතිපාදන භාවිතයට ඇති සීමාකාරී සාධක නිසා බාහිර පුහුණු ආයතන මඟින් ඉහළ පිරිවැයක් දරා ලබාගත යුතු තාක්ෂණික පුහුණුවීම් ලබා ගැනීමට තිබූ අවස්ථා ද සීමා විය.

නමුත් 2026 වර්ෂය තුළ යෝජිත මානව සම්පත් සංවර්ධන සැලැස්ම තුළ සියලුම සේවා මට්ටම්වල නිලධාරීන්ට තවදුරටත් අවශ්‍ය මූලික හා තාක්ෂණික නිපුණතාවයන් සංවර්ධනය කිරීමට අවශ්‍ය ඉඩ ප්‍රස්තා සලසා දීමට කටයුතු සැලසුම් කර ඇත.

පරිච්ඡේදය 07

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ.		
1.6	වෙනත්	අදාළ නොවේ.		

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445).**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය (මු.රෙ.135).**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
4.	**වාර්ෂික සැලසුම් සකස් කිරීම.**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ.	අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පවතී. එම නිසා වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කිරීමට නොහැකි වී ඇත.	සුදුසු නිලධාරියෙකු පත්කර දෙන ලෙස රාජ්‍ය පරිපාලන , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇත.
4.4	වාර්ෂික ඇස්තමේතුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
5	**විගණන විමසුම.**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ.	අභ්‍යන්තර විගණන තනතුර පුරප්පාඩුව පවතී. අභ්‍යන්තර විගණක අංශයක් ස්ථාපිත කර නොමැත. එම නිසා කටයුතු කිරීමට නොහැකි වී ඇත.	සුදුසු නිලධාරියෙකු පත්කර දෙන ලෙස රාජ්‍ය පරිපාලන , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇත.
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ.	අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පවතී. අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොමැත. එම නිසා කටයුතු කිරීමට නොහැකි වී ඇත.	සුදුසු නිලධාරියෙකු පත්කර දෙන ලෙස රාජ්‍ය පරිපාලන , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇත.
6.3	2018 අංක 19 දරණ විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ.	අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පවතී. අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොමැත. එම නිසා කටයුතු කිරීමට නොහැකි වී ඇත.	සුදුසු නිලධාරියෙකු පත්කර දෙන ලෙස රාජ්‍ය පරිපාලන , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇත.
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ.	අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පවතී. අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොමැත. එම නිසා කටයුතු කිරීමට නොහැකි වී ඇත.	සුදුසු නිලධාරියෙකු පත්කර දෙන ලෙස රාජ්‍ය පරිපාලන , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇත.

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
7	**විගණන හා කළමනාකරණ කමිටු.**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ.		
8	**වත්කම් කළමනාකරණය.**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තාකර තිබීම	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.	ප්‍රමාදවී සිදු කර ඇත.	
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ.	අවසන් කර ඇත.	
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ	2025 භාණ්ඩ සමීක්ෂණයට අනුව ගර්හිත භාණ්ඩ අපහරණය කර අවසන් කර ඇත.	

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9	**වාහන කළමනාකරණය.**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අදාළ නොවේ	ගර්හිත වාහන නොමැත.	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ.	වාහන 5ක පමණ සිදු කර ඇත. වාහන දෙක වර්ෂය අවසානයේ රාජකාරී කාර්යබහුලතාවය මත සිදු කිරීමට නොහැකි විය.	ඉතිරි වාහන දෙක ඉදිරියේදී නියමිත පරිදි ඉන්ධන දහන පරීක්ෂාව සිදු කරීමට කටයුතු යොදා ඇත.
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අදාළ නොවේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
10	**බැංකු ගිණුම් කළමනාකරණය.**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාළ නොවේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය.**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ.		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්.**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අදාළ නොවේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
13	**පොදු තැන්පත් ගිණුම.**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අදාළ නොවේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම.**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදී තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාළ නොවේ.		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ.		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
16	**මානව සම්පත් කළමනාකරණය.**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල නොවේ.	අදාළ පුරප්පාඩු සඳහා නිලධාරීන් පත්කර නොමැති වීම.	කාර්යය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස ඉල්ලීම් කර ඇත.
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම.**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
17.2	ආයතන පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		

7

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛ යේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අදාළ නොවේ.	2023.11.30 දිනැති රා.ප.ව.02/2018 /(i) මගින් මෙම අවශ්‍යතාවය ඉවත් කර ඇත.	

19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධන කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ.		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම.**			
20.1	ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		